







# පුස්තකාල ප්‍රවෘත්ති

# நூலகச் செய்திகள்


# LIBRARY NEWS

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

இலங்கைத் தேசிய நூலகத்தின் செய்திப் பிரசுரம்

The Newsletter of the National Library of Sri Lanka


23 වෙළුම 2 කලාපය
2002 අප්‍රේල් - ජූනි
மலர் 23 இதழ் 2
2002 ஏப்ரல் - ஜூன்
Vol. 23 No.2
April - June 2002
ISSN 1391 - 0000










පුස්තකාල ස්වයංක්‍රීයකරණය සම්මන්ත්‍රණ මාලාව
நூலகங்களைத் தன்னியக்கமாக்கும் மாநாட்டுத் தொடர்
Seminar on Library Automation at NLDSB, 7 - 24, May 2002

"ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා
[illegible]"




# පුස්තකාල ප්‍රවෘත්ති
## LIBRARY NEWS நூலகச் செய்திகள்

ශ්‍රී ලංකා ජාතික පුස්තකාලයේ ප්‍රවෘත්ති ප්‍රකාශනය

தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் செய்திப் பிரசுரம்

THE NEWSLETTER OF THE NATIONAL LIBRARY OF SRI LANKA

ආරම්භය 1973 Established 1973 ஆரம்பம் 1973



23 වන වෙළුම 2 කලාපය
2002 අප්‍රේල් - ජූනි

සංස්කාරක උපදේශක මණ්ඩලය

මහාචාර්ය තිස්ස කාරියවසම්
සභාපති

එම්. එස්. යූ අමරසිරි
අධ්‍යක්ෂ ජනරාල්

ජී.ඩී.අමරසිරි
නියෝජ්‍ය අධ්‍යක්ෂ

සංස්කාරක මණ්ඩලය
වරුණි ගඟබඩආරච්චි, පද්මා බණ්ඩාරනායක, උදිත අලහකෝන්, සුජීව හීන්කෙන්ද

සහාය සංස්කාරක
එච්. ඒ. කේ. ප්‍රේමරත්න

පරිගණක අක්ෂර සංයෝජනය
පී.එස්.කේ.ලියනගේ
එස්. වානි

මුද්‍රණය හා ප්‍රකාශනය
ප්‍රකාශන අංශය
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
නිදහස් මාවත, කොළඹ 07
ශ්‍රී ලංකාව

දුරකථනය : 674387, 698847- 260
ෆැක්ස් : 94- 1 - 685201
ඊ මේල් : pub@mail.natlib.lk
වෙබ් අඩවිය : www.natlib.lk
© ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2002
කලාපයක මිල රුපියල් 25.00 $ 2.50
වසරක දායක මුදල රුපියල් 100.00
චෙක්පත් හා මුදල් ඇණවුම්පත්
සභාපති
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
නමට යොමුකරන්න

පිටකවරය මුද්‍රණය
සමයවර්ධන ප්‍රින්ටර්ස්

மலர் 23 இதழ் 2
ஏப்ரல் - யூன் 2002

பதிப்பாசிரியர் ஆலோசனைக்குழு
பேராசிரியர் திஸ்ஸ காரியவசம்
தலைவர்

எம்.எஸ்.யு. அமரசிறி
பணிப்பாளர் நாயகம்

ஜீ.டீ. அமரசிறி
உதவிப் பணிப்பாளர்

பதிப்பாசிரியர் குழு
வருணி கங்கபடஆராய்ச்சி, பத்மா பண்டாரநாயக்க, உதித்த அழகக்கோன், சுஜீவ ஹீன்ஹெந்த

எச்.ஏ.கே. பிரேமரத்ன
விசேட பதிப்பாசிரியர்

கணினி வடிவம்
பீ.எஸ்.கே. லியனகே
எஸ். வாணி

அச்சீட்டு வெளியீடல்
வெளியீட்டுப் பிரிவு
சிறீ லங்கா தேசிய நூலகம்
தேசிய, நூலக ஆவணவாக்கல் சேவைகள் சபை, சுதந்திர வழி, கொழும்பு 07, சிறீ லங்கா
தொலைபேசி 685196, 98847- 246
பெக்ஸ் 941-685-201

© சிறீ லங்கா தேசிய நூலகம் 2001
பிரதியின் விலை ரூபா -25.00 $2.50
ஆண்டுச் சந்தா ரூபா. 100.00
சகல காசோலைகளும், தபால் கட்டளைகளும்

தலைவர்
தேசிய நூலக, ஆவணவாக்கல் சேவைகள் சபையின் பெயருக்கு எழுதப்பட வேண்டும்.

வெளிமட்டை அச்சிடல்
சமயவர்த்தன பிரிண்டர்ஸ்

Volume 23 No. 2
April - June 2002

Editorial Advisory Board

Prof. Tissa Kariyawasam
Chairman

M.S.U. Amarasiri
Director General

G.D.Amarasiri
Deputy Director

Editorial Board
Varuni Gangabadaarachchi, Padma Bandaranaike, Uditha Alahakoon, Sujeeva Heenkenda

Asst. Editor
H.A.K. Premaratna

Computer Typesetting
P.S.K. Liyanage
S. Vani

Printed & Published by
Publication Division
National Library & Documentation Services Board,
Independence Avenue, Colombo 07.
Sri Lanka.

Tel. 674387 - 698847 - 260
Fax: 94 -1 - 685201
e mail : pub@mail.natlib.lk
web page : www.natlib.lk
National Library and Documentation Services Board 2002
Price per Copy Rs. 25.00 $ 2.50
Annual Subscription Rs.100
All Cheques and Money Orders should be forwarded to

Chairman
National Library & Documentation Services Board

Cover Printed by
Samayawardhana Printers

## පටුන


| | |
|---|---|
| කතුවැකිය | 03 |
| ජාතික පුස්තකාල පුවත් | 04-06 |
| වෙනත් පුස්තකාල පුවත් | 06-09 |
| தேசிய நூலகச் செய்திகள் | 10-11 |
| பிற நூலகச் செய்திகள் | 10-14 |
| National Library News | 15-17 |
| Other Library News | 17-19 |
| තක්සිලා පාසැල් පුස්තකාල මෘදුකාංගය<br>එන්.යූ.යාපා | 20-24 |
| **Library & Information Education of Sri Lanka in comparison with those of other South Asian countries**<br>Pradeepa Wijetunga (Continued from last issue) | 25-30 |

කතුවැකිය

# ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ 12 වන සංවත්සරය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය පසුගිය දා සිය දොළොස්වන සංවත්සරය සැමරුවාය. ජාතික පුස්තකාලයට දශකයක් සපිරුණු මොහොතේ ලැබූ අත්දැකීම් සම්භාරය ද අතැතිව වඩාත් පරිපූර්ණ සේවාවක් අවශේෂ පුස්තකාල, පර්යේෂකයන් හා පාඨකයන් වෙත සැලසීමේ ප්‍රධාන අරමුණ පෙරදැරිව මෙවර ද සාංවත්සරික උත්සව සංවිධානය කොට තිබිණි. මෙම වැඩසටහන් අතර ප්‍රමුඛස්ථානයක් ගන්නා ලද්දේ පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබඳ සම්මන්ත්‍රණ මාලාවයි. පුස්තකාල ස්වයංක්‍රීයකරණය අද නිරන්තරයෙන් කථාබහට ලක්වන මාතෘකාවකි. අද්‍යතන සමාජයේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම පිණිස මෙන් ම කාර්යක්ෂම හා ඵලදායී ලෙස දැනුම ලබාදීම සඳහා පරිගණක සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගත යුතු බව නොරහසකි.

මෙහි දී පුස්තකාල ස්වයංක්‍රීයකරණයේ අභියෝග, මහජන පුස්තකාල, විශේෂ පුස්තකාල, පාසල් පුස්තකාල, උසස් අධ්‍යාපන පුස්තකාල ක්ෂේත්‍ර සම්බන්ධව මෙන් ම ස්වයංක්‍රීයකරණය සඳහා මෘදුකාංග, ප්‍රකාශන හිමිකම්, රාජ්‍ය පරිපාලනය, ජාලගතකරණය, සැලසුම්කිරීම හා පුහුණුව ආදී ක්ෂේත්‍ර විස්තරාත්මක ව සාකච්ඡාවට බඳුන් වූ අතර මෙය අදාළ ක්ෂේත්‍ර හා සම්බන්ධ ප්‍රවීණයන් රැසකගේ දැනුම බෙදා හදා ගත් සාර්ථක සම්මන්ත්‍රණ මාලාවක් බව සැමගේ අදහස විය.

පසුගිය දශකයක ගමන්මග අවලෝකනය කිරීමේ දී ජාතික පුස්තකාලය පරිහරණය කරන පාඨක සංඛ්‍යාව තවමත් සතුටුදායක ලෙස වර්ධනය වී නොතිබීම ප්‍රකට ව පෙනෙන්නට ඇති කරුණකි. එමෙන් ම ජාතික පුස්තකාලය සතු සම්පත් හා සේවාවන් පිළිබඳව පාඨක ප්‍රජාවගේ අවධානය ප්‍රමාණවත් පරිදි යොමු වී නොමැති බවක් ද පෙනෙන්නට ඇත. එහෙත් පසුගිය සම්මන්ත්‍රණ මාලාවේ දක්නට ලැබුණු එක් සුවිශේෂී ලක්ෂණයක් වූයේ සෑම සම්මන්ත්‍රණයක් සඳහා ම අපේක්ෂිත ඉලක්ක ඉක්මවා සක්‍රීය ලෙස විශාල පිරිසක් සහභාගී වීමයි.

ජාතියේ තොරතුරු අවශ්‍යතාවට ගැලපෙන හා පාඨක ප්‍රජාව ජාතික පුස්තකාලයට ආකර්ශනය වන අන්දමේ මෙවන් වැඩමුළු පැවැත්වීම ආයතනයේ ඉදිරි ගමනට මෙන් ම තොරතුරු පදනම් කරගත් ජාතික සංවර්ධනයට ද ප්‍රබල පිටුවහලක් වනු ඇත.

මෙලෙස සාර්ථක ලෙස 12 වන සංවත්සරය සැමරූ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයට ඉදිරියේ දී වඩාත් පුළුල් ව පාඨක අවශ්‍යතා සපුරාලමින් ජාතික ආයතනයක් ලෙස සුවිශාල කාර්යභාරයක් ඉටු කිරීමට හැකියාව ලැබේවා යි ශුභාශිංෂණය කරමු !

**සංස්කාරක මණ්ඩලය**

# ජාතික පුස්තකාල පුවත්


## ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානයේ 12 වැනි සංවත්සරය

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන මධ්‍යස්ථානය නොබෝදා 12 වසර සම්පූර්ණ කරන ලදී. මේ නිමිත්තෙන් ආගමික උත්සව හා පුස්තකාල ස්වයංක්‍රියකරණය පිළිබඳ සම්මන්ත්‍රණ මාලාවක් සංවිධානය කරන ලදී. මීට අමතරව පුස්තකාල ස්වයංක්‍රියකරණය පිළිබඳ පොත් හා පරිගණක මෘදුකාංග ප්‍රදර්ශනයක් ද පවත්වන ලදී.

## සම්මන්ත්‍රණ

01. පුස්තකාල ස්වයංක්‍රියකරණය පිළිබඳ සියලු ක්ෂේත්‍ර හා අළලා 2002.05.07 සිට 2002.05.24 දක්වා සම්මන්ත්‍රණ මාලාවක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී පවත්වන ලදී. මෙහි දී එක් සම්මන්ත්‍රණයක් සඳහා ප්‍රධාන දේශනයක් හා උපකාරක දේශන 3ක් පැවැත්විණ. එම සම්මන්ත්‍රණ මාලාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

- ♦ 2002.05.07 සම්මන්ත්‍රණ අංක 01 පුස්තකාල ස්වයංක්‍රියකරණ ක්‍රියාවලියේ අභියෝග
- ♦ 2002.05.08 සම්මන්ත්‍රණ අංක 02 මහජන පුස්තකාල ස්වයංක්‍රියකරණය
- ♦ 2002.05.09 සම්මන්ත්‍රණ අංක 03 පාසල් පුස්තකාල ස්වයංක්‍රියකරණය
- ♦ 2002.05.10. සම්මන්ත්‍රණ අංක 04 විශේෂ/පර්යේෂණ පුස්තකාල ස්වංක්‍රියකරණය
- ♦ 2002.05.14 සම්මන්ත්‍රණ අංක 05 පුස්තකාල සඳහා පරිගණක මෘදුකාංග
- ♦ 2002.05.15 සම්මන්ත්‍රණ අංක 06 උසස් අධ්‍යාපන ආයතන පුස්තකාල ස්වයංක්‍රියකරණය
- ♦ 2002.05.16 සම්මන්ත්‍රණ අංක 07 තොරතුරු සන්නිවේදන තාක්ෂණය ජාතික මට්ටමින් යොදා ගැනීම
- ♦ 2002.05.17 සම්මන්ත්‍රණ අංක 08 රාජ්‍ය පරිපාලනය හා තොරතුරු සන්නිවේදන තාක්ෂණය
- ♦ 2002.05.21 සම්මන්ත්‍රණ අංක 09 ප්‍රකාශන හිමිකම් සහ තොරතුරු සන්නිවේදන කටයුතු
- ♦ 2002.05.22 සම්මන්ත්‍රණ අංක 10 තොරතුරු සන්නිවේදන තාක්ෂණය හා පුහුණු කටයුතු
- ♦ 2002.05.23 සම්මන්ත්‍රණ අංක 11 පුස්තකාල ජාල
- ♦ 2002.05.24 සම්මන්ත්‍රණ අංක 12 පුස්තකාල ස්වයංක්‍රියකරණය සැළසුම් කිරීම




**සම්මන්ත්‍රණ මාලාවේ දී ප්‍රකාශයට පත් කළ සම්මන්ත්‍රණ පත්‍රිකා අලෙවිය සඳහා සූදානම් කර ඇත.**

- සම්මන්ත්‍රණ 12ක පත්‍රිකා  රු. 2000/-
- සම්මන්ත්‍රණ 06ක පත්‍රිකා හෝ දේශන පත්‍රිකා 24ක්  රු. 1000/-
- සම්මන්ත්‍රණ 03ක පත්‍රිකා හෝ දේශන පත්‍රිකා 12ක්  රු. 500/-


විමසීම : අංශ ප්‍රධාන/ප්‍රකාශන අංශය
දුරකථන අංක : 01-674387
ඊමේල් : pub@mail.natlib.lk

02. 2002.06.11 දින දකුණු පළාතේ මහජන පුස්තකාලයාධිපතීන් සඳහා ප්‍රගති සමාලෝචන සම්මන්ත්‍රණයක් ගාල්ල, වක්වැල්ල කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයේ දී පවත්වන ලදී. ඒ සඳහා මහජන පුස්තකාලයාධිපතීන් 38 දෙනෙකු සහභාගි විය.

## පුහුණු පාඨමාලා

- කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පිරිසක් සඳහා පුස්තකාල විද්‍යා පුහුණු පාඨමාලාවක් 2002.04.08 සිට 11 දක්වා මණ්ඩලීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලදී. මේ සඳහා පාඨමාලාලාභීන් 24 දෙනෙකු සහභාගී විය.

- දකුණු පළාතේ මහජන පුස්තකාල සහායකවරුන් පුහුණු කිරීමේ පාඨමාලාවක් 2002.06.07 - 10 දක්වා ගාල්ල, වක්වැල්ල කළමනාකරණ සංවර්ධන හා පුහුණු ආයතනයේ දී පවත්වන ලදී. මෙයට පාඨමාලාලාභීන් 50 දෙනෙකු සහභාගී විය.



## ලෝක පොත් දිනය හා ප්‍රකාශන හිමිකම් දිනය
## World Book & Copyright Day

ලෝක පොත් හා ප්‍රකාශන හිමිකම් දිනය මෙම වසරේ අප්‍රේල් 23 වෙනිදාට යෙදී තිබිණ. ඒ නිමිත්තෙන් සම්මන්ත්‍රණයක් ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී 2002.04.23 දින පවත්වන ලදී. මෙහි දී ප්‍රධාන දේශන නීතිවේදී මහින්ද රූපනාව මහතා හා බණ්ඩාරනායක අනුස්මරණ පුස්තකාලය හා සංස්කෘතික මධ්‍යස්ථානයේ ලේකම්, හෙන්රි සමරනායක මහතා විසින් පවත්වන ලදී. ආරම්භක උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස අධිකරණ, නීති ප්‍රතිසංස්කරණ, ජාතික ඒකාග්‍රතා හා බුද්ධ ශාසන අමාත්‍ය ගරු වී.ජ.මු.ලොකුබණ්ඩාර මහතා සහභාගී විය. මේ දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා පොත් ප්‍රකාශකයන්ගේ අනුග්‍රහය ඇතිව පොත් ප්‍රදර්ශනයක් ද ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ දී පැවැත්විණ. එමෙන් ම මෙම දිනය අරමුණු කර පෝස්ටරයක් නිර්මාණය කර එළි දැක්වීම ද එදින සිදු කෙරිණ.

### පොත් ප්‍රදර්ශන

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය 2002 අප්‍රේල් - ජූනි කාර්තුව තුළ පහත සඳහන් පොත් ප්‍රදර්ශන පවත්වන ලදී.

| දිනය | ස්ථානය |
|---|---|
| 2002.04.23 - 27 | ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය |
| 2002.06.30 සිට 2002.07.06 | පිටකෝට්ටේ ශාන්ත තෝමස් විද්‍යාලය |

### පුස්තකාල ශ්‍රේණිගත කිරීම

රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තු පුස්තකාලයේ, තොරතුරු හා මාධ්‍ය අංශය සහ ගාල්ල ආචාර්ය රිචඩ් පතිරණ මහජන පුස්තකාලය අධිශ්‍රේණිය සඳහා උසස් කරන ලදී.

## නව සභාපති වැඩ භාරගැනීම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ 11 වන සභාපති ලෙස මහාචාර්ය තිස්ස කාරියවසම මහතා 2002 ජුනි මස සිට වැඩ භාර ගත්තේය. ප්‍රකට කතුවරයෙකු වන එතුමා ජනසාහිත්‍යය, බුද්ධාගම, ජනසන්නිවේදනය සහ නිර්මාණාත්මක සාහිත්‍යය යන ක්ෂේත්‍රවල ප්‍රවීණයෙකු ලෙස හැඳින්විය හැක. එමෙන් ම ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ හිටපු සභාපති වශයෙන් හා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති වශයෙන් ද, එම විශ්ව විද්‍යාලයේ ම සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු වශයෙන් ද සේවය කර ඇත. තවද එතුමා දැනට එම විශ්ව විද්‍යාලයේ ම වැඩ බලන උප කුලපති ලෙස කටයුතු කරයි. අප ආයතනයේ දියුණුව සඳහා විශාල මෙහෙවරක් කිරීමට එතුමාට හැකියාව ලැබේවායි ප්‍රාර්ථනය කරමු.

## සභාපති සේවයෙන් විශ්‍රාම යාම

ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ සභාපති වශයෙන් වසර 7ක් සේවය කළ හෙන්රි සමරනායක මහතා පසුගිය දා සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. ඒ මහතා මණ්ඩලයේ දියුණුව සඳහා විශාල මෙහෙවරක් ඉටු කළ බව මෙහි දී සිහිපත් කළ යුතු ය. එතුමාට සුවබර විශ්‍රාම දිවියකට ශුභාශිංෂණය පතමු.

# වෙනත් පුස්තකාල පුවත්

## බණ්ඩාරනායක අනුස්මරණ පුස්තකාලය හා සංස්කෘතික මධ්‍යස්ථානය

එස්.ඩබ්.ආර්.ඩී.බණ්ඩාරනායක ශ්‍රීමතාණන් හා සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය සිහිපත් කරනු වස් ඉදිකරන ලද බණ්ඩාරනායක අනුස්මරණ පුස්තකාලය හා සංස්කෘතික මධ්‍යස්ථානය අත්තනගල්ල, හොරගොල්ලේ දී 2002 මැයි 03 වන දින විවෘත කෙරිණ. මෙම පුස්තකාලය සාමාන්‍ය කියවීම්, පොත් බැහැරදීම්, විමර්ශන සේවා සහ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානයක් මෙන් ම ළමයින් සඳහා කියවීම් හා බැහැරදීම් අංශයකින් ද සමන්විත වේ.

## NESEC පදනම පුස්තකාල සංවර්ධනය සඳහා ජපන් ආධාර

කඩවත, රන්මුතුගල නෙසෙක් (NESEC) පදනම විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානයේ සේවා පවත්වාගෙන යාම සඳහා ජපානයේ ආර්ටික් (ARTIC) සංවිධානය විසින් යෙන් දස ලක්ෂයක (රු. 7,50,000.00) මුදලක් ලබා දී ඇත. මෙයට අමතර ව ජපානයේ නාරා යුනෙස්කෝ ආයතනය ද යෙන් ලක්ෂයක (රු. 75,000.00) මුදලක් ලබා දී ඇත.

නෙසෙක් පුස්තකාලය හා තොරතුරු මධ්‍යස්ථානය දිවයිනේ ප්‍රවීන පුස්තකාලයාධිපතිවරුන්ගෙන් සමන්විත උපදේශක කමිටුවක මග පෙන්වීම යටතේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වන තොරතුරු එක්රැස් කිරීමේ හා බෙදා හැරීමේ ව්‍යාපෘතියකි.

ගම්පහ සහ මහර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්හි පදිංචි පොදු ජනතාව සඳහා පුස්තකාල හා තොරතුරු සේවා රැසක් පවත්වාගෙන යනු ලබන මෙම පුස්තකාලය කැළණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යාව හදාරන සිසු සිසුවියන්ට ප්‍රායෝගික පුහුණුව ලබා දෙන පුස්තකාලයක් වශයෙන් ද කටයුතු කරනු ලැබේ.

## ගිනිගත්හේන මහජන පුස්තකාලය

### නවතම සඟරාවක් එළි දකී

ගිනිගත්හේන මහජන පුස්තකාලයීය පාඨක සමාජය ගිනිගත්හේන මධ්‍ය මහා විද්‍යාලයීය මාධ්‍ය ඒකකය හා ගම්පොල විමංසා උසස් අධ්‍යාපන ආයතනය එක්ව "විමංසා" නමින් අධ්‍යාපනික සඟරාවක් නිර්මාණය කිරීමට කටයුතු සැළසුම් කර ඇත. මේ සඳහා කොත්මලේ ප්‍රජා ගුවන් විදුලි සේවයේ මාධ්‍ය සහයෝගය ද ලැබේ.

## පුස්තකාල විවෘත කිරීම


◆ නුගේගොඩ, පාගොඩ ධර්ම දූත මධ්‍යස්ථානයේ අභිනවයෙන් ඉදිකරන ලද පුස්තකාලය සහිත දෙමහල් මන්දිරය 2002 ජුනි මස 16 වැනිදා පෙ.ව. 9.00ට උත්සවාකාරයෙන් විවෘත කෙරිණි. එම ධර්මදූත මධ්‍යස්ථානයේ නිර්මාතෘ අතිපූජ්‍ය වීරකැටියේ කවීශ්වර නාහිමිපාණන්ට උපහාර පිණිස මෙය ඉදිකෙරුණේ දහම් පාසල් ගොඩනැගිලි සංවර්ධන සමිතියේ මෙහෙයවීමෙන් දෙමව්පියන් සහ දායක බැතිමතුන්ගේ පරිත්‍යාගයෙනි.

මේ සඳහා පවත්වනු ලැබූ උත්සව සභාවේ මුලසුන හොබවන ලද්දේ විද්‍යාලංකාර පරිවෙනාධිපති කැළණිය විශ්ව විද්‍යාලයේ කුලපති හා කොළඹ හලාවත දෙදිසාවේ ප්‍රධාන සංඝනායක අතිපූජ්‍ය වැලමිටියාවේ කුසලධම්ම නාහිමිපාණන්ය.

◆ බප/කැළ.නැලිගම ශ්‍රී සංඝමිත්තා මහා විද්‍යාලයේ ලෝක බැංකු ආධාර යටතේ අභිනවයෙන් ඉදිකරන ලද අංග සම්පූර්ණ පුස්තකාල ගොඩනැගිල්ල පසුගිය මැයි මස 24 වන දා සවස පාසල් අධ්‍යාපන අමාත්‍ය ගරු සුරනිමල රාජපක්ෂ මැතිතුමා අතින් විවෘත කෙරිණි.

## සීතාවකපුර මහජන පුස්තකාලය

සීතාවකපුර මහජන පුස්තකාලය විසින් භාවිතයට ගැනීමට සුදුසු පොත් යළි සකස් කර පරිහරණයට එක් කිරීම සඳහා පාඨක ප්‍රජාව හා කාර්ය මණ්ඩලයේ සහභාගිත්වයෙන් ශ්‍රමදානයක් 2002.06.08 දින පවත්වන ලද අතර මෙහි දී සහභාගීවූවන්ට මෙම පොත් සකස් කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම නිසා ඉවත් කර තිබූ පොත් රාශියක් ප්‍රතිසංස්කරණය කර භාවිතයට ගැනීමට හැකි විය.



## පූහුල්වැල්ල මහජන පුස්තකාලය

කිරින්ද පූහුල්වැල්ල මහජන පුස්තකාලයේ 2002 වර්ෂය සඳහා පුස්තකාල උපදේශක හා සංවර්ධන කමිටුව 2002.06.28 දින තෝරා පත්කර ගන්නා ලදි. එම කමිටුව විසින් ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩ සටහන් අතර,

- ඉංග්‍රීසි කථා පොත් මිළ දී ගැනීම
- පුස්තකාල සංවර්ධන අරමුදලක් පිහිටුවීම හා අරමුදල තර කර ගැනීම සඳහා දානපතියන්ගේ හා උගතුන්ගේ සහාය ලබා ගැනීම
- ටිකට් පොත් අලෙවිය ආදිය සඳහන් කළ හැකිය.

## කළගුණ සිහිකිරීමේ පිංකමක්

ශ්‍රී ලංකාවේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යාපන ක්ෂේත්‍රයේ පුරෝගාමියෙක් වූ එච්.තිලකබන්දු මහතා දිවංගත වී තෙමසක් පිරුණු දිනයේදී ඒ මහතාට පිං පිණිස දානමය පිංකමක් පසුගිය දා කඩවත රත්මුතුගල මහා විහාරයේදී පැවැත්විණි.

කැලණිය විශ්ව විද්‍යාලයේ පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයනාංශ ආචාර්ය මණ්ඩලයේ හා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දායකත්වයෙන් සිදු කරන ලද මේ පිංකමට ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල් උපාලි අමරසිරි මහතා ඇතුළු කාර්ය මණ්ඩලයේ දායකත්වය ද ලැබුණි. තව ද මෙරට ප්‍රධාන පෙළේ පුස්තකාලයාධිපතිවරුන් රැසක් මේ පිංකමට දායක වූහ.

භික්ෂූන් දහනමක් විෂයෙහි සංඝගත දක්ෂිණාවක්, භික්ෂු පුහුණු ආයතනයේ හා ළමා නිවාසයේ ළමයින් උදෙසා දානයක් හා පුස්තකාල පොත් පරිත්‍යාග කිරීමේ වැඩ සටහනක් ද මේ පිංකමට ඇතුළත් විය.

## මාර්ටින් වික්‍රමසිංහ 112 වැනි ජන්ම සංවත්සර උළෙල

මහා ගත්කරු මාර්ටින් වික්‍රමසිංහයන්ගේ එකසිය දොළොස්වැනි ජන්ම සංවත්සර උළෙල පසු ගිය මැයි මස 29 දා සිට 31 දා දක්වා කොළඹ ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේදී පවත්වනු ලැබිණ.

පාසල් අධ්‍යාපන අමාත්‍ය ගරු සුරනිමල රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් 29 වෙනිදා පෙ.ව. 9.30ට ඇරඹූ මෙම උත්සව මාලාව 31 වෙනිදා දක්වා දිනපතා පෙ.ව. 9.30 සිට ප.ව. 4.30 දක්වා පැවැත්විණි. මෙම දිනවල දී පොත් ප්‍රදර්ශන, සමරු ඡායාරූප ප්‍රදර්ශන, සාහිත්‍ය සම්මන්ත්‍රණ පැවැත් වූ අතර 30 දා මෙම උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස අධිකරණ, නීති ප්‍රතිසංස්කරණ, ජාතික ඒකාග්‍රතා හා බුද්ධ ශාසන අමාත්‍ය ගරු වි.ජ.මු.ලොකුබණ්ඩාර මැතිතුමා සහභාගි විය.

## Regional Centre for Strategic Studies පුස්තකාලය

ක්‍රමෝපාය අධ්‍යයන සඳහා වන කලාපීය මධ්‍යස්ථානයේ (RCSS) නව පුස්තකාලය එහි ආරම්භක අධ්‍යක්ෂවරයා වන මහාචාර්ය ෂෙල්ටන් යූ. කොඩිකාර නමින් විවෘත කරන ලදී. එතුමාගේ අගනා පොත් එකතුවක් ද පුස්තකාලයට පරිත්‍යාග කිරීම සිදු කරන ලදී. මෙම උත්සවයට ගරු මානව සම්පත් සංවර්ධන, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ආචාර්ය කරුණාසේන කොඩිතුවක්කු මහතා ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී විය. පුස්තකාලයේ පොත් එකතුවට වාර්ෂික වාර්තා, RCSS ප්‍රකාශන, වාර සඟරා, වාර්ෂික පොත් හා පුවත්පත් අඩංගු වේ.

## සම්මන්ත්‍රණ

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ විශේෂ පුස්තකාල කණ්ඩායම විසින් "තත්ව පාලනය : පුස්තකාලයාධිපතීන්ගේ අභියෝග" යන මැයෙන් සම්මන්ත්‍රණයක් 2002.04.29 දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී. මෙහි දී ප්‍රධාන සම්පත් දායකයා ලෙස එස්.පී.එස්. ලංකා (පුද්ගලික) සමාගමේ ව්‍යාපාර සංවර්ධන කළමනාකාර ඩී.ධර්මදාස මහතා දායක විය.

## නැගෙනහිර විශ්ව විද්‍යාලය

**පුස්තකාල සතිය:**

නැගෙනහිර විශ්ව විද්‍යාලයීය පුස්තකාල සතිය 2002.06.21 සිට 2002.06.23 දක්වා එම විශ්ව විද්‍යාලයේදී පවත්වන ලදී. පුස්තකාල සතිය සඳහා විවිධ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කෙරිණ. පොත් ප්‍රදර්ශන හා සල්පිල, ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ පුස්තකාල හා විඥාපන විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව ආරම්භ කිරීම සහ පුස්තකාල ක්ෂේත්‍රයේ නියුතු අය සඳහා වැඩමුළුවක් ආදිය සංවිධානය කර තිබිණ.

## ශ්‍රී ලංකා පුස්තකාල සංගමය

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 42 වන වාර්ෂික සමුළුව 2002.06.28 වන දින දවස පුරා ගලදාරී හෝටලයේදී පැවැත්විණ. එහි ප්‍රධාන අමුත්තා ලෙස ආර්ථික ප්‍රතිසංස්කරණ, විද්‍යා හා තාක්ෂණ අමාත්‍ය ගරු මිලින්ද මොරගොඩ මහතා සහභාගී විය. ප්‍රධාන දේශනය සහභාගීත්ව සංවර්ධන ආයතනයේ සම සභාපති සුසිල් සිරිවර්ධන මහතා විසින් පවත්වන ලදී.

## අධ්‍යාපනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT)

තොරතුරු සන්නිවේදනය, තාක්ෂණය, අධ්‍යාපනය සඳහා යොදා ගැනීම සම්බන්ධයෙන් වෙබ් අඩවියක් නිර්මාණය කර ඇත. මෙමගින් ආසියානු පැසිපික් කලාපය කෙරෙහි වැඩි අවධානය යොමු කර මින් ආසියානු පැසිපික් කලාපයේ අධ්‍යාපනය සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම සඳහා වන යුනෙස්කෝ - ජපාන භාරකාර අරමුදලේ තොරතුරු මෙන් ම නවතම ප්‍රවෘත්ති හා සම්පත් පිළිබඳ තොරතුරු දැක්වේ. මෙහි වෙබ් ලිපිනය http://www.unesco.org/bangkok/ict මෙම වෙබ් අඩවියට ඇතුළත් කළ යුතු දේ හෝ අදහස් පහත සඳහන් ලිපිනයට යොමු කළ හැක.

**Carmelita L.Villanueva,**
**Chief,**
**Information Programme and Services**
**(IPS) UNESCO Asia and Pacific Regional Bureau for Education 920, Sulchumvit Road, Prakanong, Bangkok,**
**10110,**
**Thailand,**
**Tel: 66-02-3910577, Fax : 66-02-3910866**
**E-mail : ips@unescobkk.org**
**http://www.unescobkk.org**

## පුස්තකාල සඳහා
## ලිපි ද්‍රව්‍ය සහ උපකරණ

ලිපි ද්‍රව්‍ය : පාඨක බලපත්‍ර
සූචි පත්‍රිකා
පොත් තුණ්ඩු
දින පත්‍රිකා
පොත් සාක්කු
නියමු ලේබල්
පරිග්‍රහණ ලේඛන (පිටු 150)
පරිග්‍රහණ ලේඛන (පිටු 300)
සාමාජික අයදුම් පත් (සිංහල, දෙමළ, ඉංග්‍රීසි)

ජාතික පුස්තකාල පොත් හල
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන
සේවා මණ්ඩලය
අංක 14,නිදහස් මාවත
කොළඹ 07.

# தேசிய நூலகச் செய்திகள்

## தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையத்தின் 12 ஆவது நிறைவு விழா

தேசிய நூலக ஆவணவாக்கல் மத்திய நிலையமானதுஅண்மையில் தனது 12 ஆவது வருடத்தினை பூர்த்தி செய்தது. இதன் பொருட்டு சமய நிகழ்ச்சிகளும், மற்றும் நூலகங்களை தன்னியக்க நூலகங்களாக்குவது தொடர்பான மாநாட்டுத் தொடர் ஒன்றும் ஒழுங்கு செய்யப்பட்டிருந்தது. இதற்கும் மேலால் நூலகங்களை தன்னியக்க மாக்குதல் தொடர்பான நூல்கள் மற்றும் கணினி மென்பாண்டங்களின் கண்காட்சி ஒன்றும் நடத்தப்பட்டது.

### மாநாடு

நூலகங்களை தன்னியக்கமாகும் விடயத்தின் பல்வேறு துறைகள் தொடர்பாகவும் மாநாட்டு தொடர் ஒன்று 2002.05.07 ஆம் திகதிகளில் இருந்து 2002.05.24 வரை தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையில் நடத்தப்பட்டது. இங்கு ஒரு மாநாட்டின் பொருட்டு பிரதான விரிவுரை ஒன்றும் துணை விரிவுரைகள் 03 உம் நடத்தப்பட்டன. அவ் விரிவுரைத் தொடரின் விபரம் கீழே தரப்பட்டுள்ளது.

- ✡ 2002.05.07 மாநாட்டு இலக்கம் 01 - நூலகங்களைத் தன்னியக்கமாக்குவதில் உள்ள சவால்கள்
- ✡ 2002.05.08 மாநாட்டு இலக்கம் 02 - பொது நூலகங்களைத் தன்னியக்கமாக்குதல்
- ✡ 2002.05.09 மாநாட்டு இலக்கம் 03 - பாடசாலை நூலகங்களை தன்னியக்க நூலகங்களாக்குதல்
- ✡ 2002.05.10 மாநாட்டு இலக்கம் 04 - விசேட / ஆராய்ச்சி நூலகங்களை தன்னியக்க நூலகங்களாக்குதல்
- ✡ 2002.05.14 மாநாட்டு இலக்கம் 05 - நூலகங்களுக்கான கணினி மென்பாண்டங்கள்
- ✡ 2002.05.15 மாநாட்டு இலக்கம் 06 - உயர் கல்வி நிறுவன நூலகங்களைத் தன்னியக்க நூலகங்களாக்குதல்
- ✡ 2002.05.16 மாநாட்டு இலக்கம் 07 - தகவல் தொடர்புத் தொழில்நுட்பத்தை தேசிய கல்வி மட்டத்தில் ஈடுபடுத்துவது
- ✡ 2002.05.17 மாநாட்டு இலக்கம் 08 - அரச நிருவாகம், தகவல் தொடர்புத் தொழில்நுட்பம்
- ✡ 2002.05.21 மாநாட்டு இலக்கம் 09 - வெளியீட்டு உரிமை மற்றும் தகவல் தொடர்புச் செயற்பாடு
- ✡ 2002.05.22 மாநாட்டு இலக்கம் 10 - தகவல் தொடர்புத் தொழில்நுட்பமும் பயிற்சிச் செயற்பாடும்
- ✡ 2002.05.23 மாநாட்டு இலக்கம் 11 - நூலக வலையமைப்பு
- ✡ 2002.05.24 மாநாட்டு இலக்கம் 12 - நூலகங்களைத் தன்னியக்கமாக்குவதை திட்டமிடல்


இம் மாநாட்டுத் தொடரின் போது வெளியிடப்பட்ட மாநாட்டு அறிக்கைகள் விற்பனைக்குள்ளது.

- ✡ 12 மாநாடுகளினதும் அறிக்கைகள் ரூ. 2000/=
- ✡ 06 மாநாடுகளினது அறிக்கைகள் ரூ. 1000/=
- ✡ 03 மாநாடுகளினது அறிக்கைகள் ரூ. 500/=

## மாநாடு

2002.06.11 ஆம் திகதி தென்மாகாண பொது நூலகங்களின் நூலகர்களின் அபிவிருத்தி மதிப்பாய்வொன்று, காலி, வக்வல்ல முகாமைத்துவ அபிவிருத்தி மற்றும் பயிற்சி நிறுவனத்தில் நடத்தப்பட்டது. அதன் பொருட்டு 38 பொது நூலகர்கள் பங்குபற்றினர்.

## உலக நூல்த் தினமும் வெளியீட்டு உரிமைத் தினமும்




உலக நூல் தினம் மற்றும் வெளியீட்டு உரிமைத் தினமானது இவ் வருடம் ஏப்ரல் மாதம் 23 ஆம் திகதி நடைபெற்றது. அதன் பொருட்டு மாநாடு ஒன்று தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையில் 2002.04.23 ஆம் திகதி நடத்தப்பட்டது. அங்கு பிரதான விரிவுரைகள் சட்டத்தரணி திரு மஹிந்த ரலப்பனாவ மற்றும் பண்டாரநாயக்க ஞாபகார்த்த நூலகம் மற்றும் கலாசார மத்திய நிலையத்தின் செயலாளர் திரு. ஹென்றி சமரநாயக்காவினால் நடத்தப்பட்டன. ஆரம்ப விழாவின் விசேட அதிதியாக நீதிமன்ற, சட்ட மறுசீரமைப்பு, தேசிய ஒருங்கிணைப்பு மற்றும் புத்தசாசன அமைச்சர் கௌரவ வி.ஐ.மு. லொக்குபண்டார அவர்கள் கலந்து கொண்டார்கள், இத் தினத்தை கொண்டாடு முகமாக சிறீலங்கா நூல் வெளியீட்டாளர்களின் உதவியுடன் நூற் கண்காட்சி ஒன்றும், தேசிய நூலக ஆவணவாக்கல் , சேவைகள் சபையில் நடத்தப்பட்டது. அதே போல இத் தினத்தைக் கொண்டாடு முகமாக சுவர் ஒட்டி (போஸ்டர்) ஒன்றும் நிர்மாணிக்கப்பட்டு வெளியிட்டு வைக்கப்பட்டது.

## பயிற்சிப் பாடநெறி

✡ தொழில்நுட்பக் கல்வி மற்றும் பயிற்சி வழங்கும் திணைக்களத்தின் ஊழியர்களின் பொருட்டு நூலக விஞ்ஞான பயிற்சி பாடநெறி ஒன்று 2002.04.08 திகதியில் இருந்து 11 ஆம் திகதி வரை சபையின் கேட்போர் கூடத்தில் நடத்தப்பட்டது. இப் பாடநெறியில் 24 ஊழியர்கள் பங்குபற்றினர்.

✡ தென் மாகாண பொது நூலகங்களின் நூலக உதவியாளர்களுக்கு பயிற்சி வழங்கும் பாடநெறி ஒன்று 2002.06.07-10 ஆம் திகதி வரை காலி, வக்வல்ல முகாமைத்துவ அபிவிருத்தி மற்றும் பயிற்சிநிறுவனத்தில் நடத்தப்பட்டது. இப் பாடநெறியில் 50 ஊழியர்கள் பங்குபற்றினர்.

## நூற் கண்காட்சி

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையினால் 2002 ஏப்ரல்-யூன் மாதங்களிற்கான காலாண்டில் கீழ்க்காட்டப்பட்டுள்ளவாறு நூற் கண்காட்சிகள் நடத்தப்பட்டன.

| திகதி | இடம் |
|---|---|
| 2002.04.23-27 | தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபை |
| 2002.06.30 இலிருந்து 2002.07.06 வரை | பிற்ற கோட்டை சாந்த தோமஸ் வித்தியாலயம் |

## நூலகங்களைத் தரநிர்ணயம் செய்தல்

அரச மொழித் திணைக்கள நூலகம், தகவல் மற்றும் ஊடகப் பிரிவு, காலி கலாநிதி றிச்சாட் பத்திரண பொது நூலகம் என்பன விசேட தர நூலகங்களாக தரம் உயர்த்தப்பட்டுள்ளன.

## பண்டாரநாயக்க ஞாபகார்த்த நூலகமும் காலாசார மத்திய நிலையமும்

சிறீமன் எஸ்.டபிள்யூ.ஆர்.டீ. பண்டாரநாயக்க மற்றும் சிறீமாவோ பண்டாரநாயக்க ஞாபகார்த்த நூலகமும் கலாசார மத்திய நிலையமும் ஹொரகொல்லையில் அண்மையில் திறந்து வைக்கப்பட்டது. இந் நூலகம் சாதாரண வாசிப்பு, நூல் இரவல் வழங்குதல், உசாத்துணைச் சேவை, தகவல் தொழில்நுட்ப மத்திய நிலையம் என்பவற்றுடன் சிறுவர்களின் பொருட்டு வாசிப்பு மற்றும் இரவல் வழங்கும் பிரிவு ஒன்றையும் கொண்டதாகும்.

## தலைவர் சேவையில் இருந்து ஓய்வு பெறுதல்

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் தலைவராக 7 வருடங்களாக சேவையாற்றிய திரு. ஹென்றி சமரநாயக்க கடந்த நாட்களில் சேவையிலிருந்து ஓய்வு பெற்றார். அவர் சபையின் முன்னேற்றத்தின் பொருட்டு பாரியளவில் முயற்சி செய்ததை இங்கு நினைவு கூறல் வேண்டும். சேவையிலருந்து ஓய்வு பெறும் அவருக்கு சகல சௌபாக்கியங்களும் கிடைக்கப் பிரார்த்திப்போமாக.

## புதிய தலைவர் வேலைப் பொறுப்பேற்றார்

தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் 11 ஆவது தலைவராக பேராசிரியர் திஸ்ஸ காரியவசம் அவர்கள் 2002 யூன் மாதத்திலிருந்து வேலையைப் பொறுப்பேற்றார். அவர் எழுத்தாளராக நாடோடி இலக்கியம், பௌத்த சமயம், பொதுசனத் தொடர்பாடல், ஆக்க இலக்கியங்கள் என பல்வேறு துறைகளில் விற்பன்னராவார் என்பதைக் குறிப்பிட வேண்டும். அதேவேளை தொலைக்காட்சிக் கூட்டுத்தாபனத்தின் முன்னைநாள் தலைவராகவும் ஸ்ரீ ஜயவர்த்தனபுர பல்கலைக்கழகத்தின் கலைப் பீடத்தின் பீடாதிபதியாகவும், அப் பல்கலைக்கழகத்திலேயே சிங்களம் மற்றும் பொதுசனத் தொடர்புப் பிரிவின் சிரேஷ்ட பேராசிரியராகவும் சேவையாற்றியுள்ளார். எமது நிறுவனத்தின் அபிவிருத்தியின் பொருட்டு பெருமளவில் முயற்சி எடுப்பதற்கு அவருக்கு சக்தி கிடைக்க வேண்டுமெனப் பிரார்த்திக்கின்றோம்.

## பிற நூலகங்களின் செய்திகள்

**மன்றம் நூலக அபிவிருத்திக்கான ஜப்பானிய உதவி**

கடவத்தை, ரண்முத்துக்கல நெசெக் (NESEC) மன்றத்தினால் நடைமுறைப்படுத்தப்பட்டு வரும் நூலக தகவல் மத்திய நிலையத்தின் சேவையை நடைமுறைப்படுத்திச் செல்லும் பொருட்டு ஜப்பானிய ஆர்டிக் (NESEC) அமைப்பினால் பத்து இலட்சம் யென்கள் (ரூபா. 7,50,000.00) வழங்கப்பட்டுள்ளது. இதற்கும் மேலால் ஜப்பானிய நாரா யுனெஸ்கோ நிறுவனமும் ஒரு இலட்சம் யென்களை (ரூபா 75,000.00) வழங்கியுள்ளது.

நெசெக் நூலகம் மற்றும் தகவல் மத்திய நிலையமானது நாட்டில் உள்ள நூலக விற்பன்னர்களைக் கொண்ட ஆலோசனைக் குழுவின் வழிகாட்டலின் கீழ் கம்பஹா மாவட்டத்தினுள் தகவல்களைச் சேகரித்து பிரித்து வழங்கும் செயற்திட்டமாகும்.

கம்பஹா மற்றும் மஹர பிரதேச சபை ஆட்சிக்குட்பட்ட பிரதேசங்களில் வாழும் பொதுமக்களின் பொருட்டு நூலக தகவல் சேவைகள் பலவற்றை நடைமுறைப்படுத்திச் செல்லும் இந் நூலகம் களனிப் பல்கலைக்கழகத்தில் நூலக தகவல் விஞ்ஞான பாடநெறியை பின்பற்றும் மாணவ மாணவிகளிற்கு செய்முறைப் பயிற்சி வழங்கும் நூலகமாகவும் செயற்படுகின்றது.

இலங்கை நூலக சங்கத்தைச் சேர்ந்த அரசாங்க நூலகர்கள் குழுவும் தொழிற் திணைக்களத்தின் ஊழியர் கல்வி பிரிவும் இணைந்து நடத்திய "வள முகாமைத்துவம்" - நூலகர்கள் முகாமையாளர்களுக்காக" என்னும் தொனிப் பொருளின் கீழ் 2002.02.21 ஆம் திகதி மாநாடொன்றை நடத்தின.

## கினிகத்ஹேன பொது நூலகம்

**புதிய சஞ்சிகை ஒன்றை வெளியிடுதல்**

கினிகத்ஹேன பொது நூலகத்தின் வாசகர் சமூகமும் கினிகத்ஹேன மத்திய மகா வித்தியாலயத்தின் தொடர்புப் பிரிவும், கம்பொளை "விமங்சா" என்னும் தலைப்பின் கீழ் கல்விச் சஞ்சிகை ஒன்றை வெளியிடுவதற்கு திட்டமிடப்பட்டுள்ளன. இதன் பொருட்டு கொத்மலை பிரஜா ஒலிபரப்பு சேவையும் உதவி வழங்குகின்றது.

## நூலகங்களைத் திறத்தல்

நுகேகொடை, பாகொடை தர்மதூத மத்திய நிலையத்தினால் புதிதாக நிர்மாணிக்கப்பட்ட நூலகத்துடன் கூடிய இரண்டு மாடிக் கட்டிடமானது 2002 யூன் மாதம் 16 ஆம் திகதி மு.ப. 9.00 மணிக்கு உத்தியோக பூர்வமாகத் திறந்து வைக்கப்பட்டது. இது தர்மதூத மத்திய நிலையத்தின் ஸ்தாபகரான மதிப்புக்குரிய வீரகட்டியே கவீஸ்வர தேரர் அவர்களின் சேவைநலம் பாராட்டு முகமாக நிர்மாணிக்கப்பட்டது. இதை தஹம் பாடசாலையில் கட்டிட அபிவிருத்தி சங்கமானது பெற்றோரினதும் பக்திமான்களினதும் அன்பளிப்புடன் கட்டியது.

**இதன் பொருட்டு நடத்தப்பட்ட விழாவின்**

தலைமைத்துவத்தை வித்தியாலங்கார பிரிவேனாதிபதியும், களனிப் பல்கலைக்கழக குலபதியும், கொழும்பு சிலாபம் ஆகிய இரு மாவட்டங்களின் பிரதான சங்கநாயகருமான அதி வணக்கத்திற்குரிய வலமிடியாவே குசலதம்ம நாஹிமி அவர்கள் ஏற்றிருந்தார்.

மேமா/கள நலிகம சிறீ சங்கமித்தா மகாவித்தியாலயத்தில் உலக வங்கியின் உதவித் திட்டத்தின் கீழ் புதிதாக நிர்மாணிக்கப்பட்டதும் பூரணமானதுமான நூலக கட்டிடம் ஒன்று கடந்த மே மாதம் 24 ஆம் திகதி பிற்பகல் பாடசாலைக் கல்வி அமைச்சர் திரு. சுரநிமல ராஜபக்ஷ அவர்களினால் திறந்து வைக்கப்பட்டது.

## புஹூள்வல்ல பொது நூலகம்

கிரிந்த, புஹூள்வல்ல பொது நூலகத்தில் 2002 ஆம் ஆண்டிற்காக நூலக ஆலோசனை மற்றும் அபிவிருத்திக் குழு ஒன்று 2002.06.28 ஆம் திகதி தெரிவு செய்யப்பட்டுள்ளது. அக் குழுவினால் எதிர்காலத்தில் நடைமுறைப்படுத்த திட்டமிட்டிருக்கும் வேலைத்திட்டங்களில்

- ✡ ஆங்கிலக் கதைப் புத்தககங்களைக் கொள்வனவு செய்தல்
- ✡ ரிக்கெற் விற்பனை
- ✡ நூலக அபிவிருத்தி நிதியம் ஒன்றை ஏற்படுத்துவதும் நிதியத்தைக் கட்டியெழுப்புவதற்கு செல்வந்தர்களினதும் கல்வி மான்களினதும் உதவியைப் பெற்றுக் கொள்ளுதல்

- ✡ தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையிலிருந்து நூல் மட்டை கட்டும் தொகுதியொன்றைப் பெற்றுக் கொள்ளுதல்
- ✡ நூற் பட்டியல் அட்டைப் பேழை ஒன்றைப் பெற்றுக் கொள்ளுதல் என்பன குறிப்பிடத்தக்கவையாகும்.

## சீதாவக்கபுர பொது நூலகம்

சீதாவக்கபுர பொது நூல் நிலையத்தினால் திருத்தியமைத்து மீள பாவனைக்கு எடுக்கக் கூடிய நூல்களை மீள ஒழுங்கமைத்து பாவனைக்கு விடும் நோக்கத்துடன் வாசகர்கள் மற்றும் தொழில் நுட்பக்குழுவின் உதவியுடன் 2002.06.08 ஆம் திகதி சிரமதானம் ஒன்று நடத்தப்பட்டுள்ளதுடன், இங்கு இதில் பங்கு பற்றியவர்களுக்கு இந் நூலை திருத்தியமைப்பதற்கு தேவையான ஆலோசனைகளும் வழங்கப்பட்டதனால், தட்டில் இருந்து அகற்றப்பட்டிருந்த பெருமளவிலான நூல்களை திருத்தியமைத்து பாவனைக்கு எடுப்பதற்கு இயலுமானது.

## சேவை நலன் பாராட்டும் புண்ணியகர்மம்

இலங்கையில் நூலகங்கள் மற்றும் நூலக விஞ்ஞானக் கல்வித்துறையின் முன்னோடிகளில் ஒருவரான திரு. எச். திலபந்து அவர்கள் காலமாகி மூன்று மாதங்கள் நிறைவடைந்த திகதியில் அவருக்கு புண்ணியம் சேர்க்குமுகமாக, பாரிய புண்ணிய கர்ம நிகழ்ச்சியொன்று, கடவத்தை ரண்முத்துகல மஹா விகாரையில் நடத்தப்பட்டது.

களனிப் பல்கலைக்கழகத்தின் நூலக தகவல் விஞ்ஞானக் கல்விப் பிரிவின் விரிவுரையாளர்களினதும், மாணவ மாணவிகளினதும் பங்களிப்புடன் நடத்தப்பட்ட இந்தப் பாரிய புண்ணிய கர்ம நிகழ்ச்சியில் தேசிய நூலக ஆவணவாக்கல் சேவைகள் சபையின் பணிப்பாளர் நாயகம் திரு. உபாலி அமரசிறி உள்ளடங்க ஊழியர்களின் பங்களிப்பும் கிடைத்தது. மேலும் இந்த நாட்டின் பிரதான நூலகர்கள் பலரும் இப் புண்ணிய கர்ம விடயத்தில் பங்குபற்றினர்.

பத்து பிக்குமார்களுக்கு விசேட சங்கதானமும், பிக்கு பயிற்சி நிறுவனம் மற்றும் சிறுவர் இல்லங்களில் உள்ள நூற்றுககும் மேற்பட்ட சிறுவர்களுக்கு அன்னதானமும், பாடசாலை நூல்களும் அன்பளிப்புச் செய்யப்பட்டமை யும் இந் நிகழ்ச்சித் திட்டத்தினுள் அடங்கும்.


வெளியாகிய புதிய நூல்கள் தொடர்பான தகவல்களுக்கு தேசிய நூலகத்தின் இரு வெளியீடுகள்

இலங்கைத் தேசிய நூற்பட்டியல் மற்றும் இலங்கைத் தேசிய நூற்பட்டியல் திரட்டப்பட்ட ஆங்கிலப் பகுதி - 2000

நாட்டில் வெளியாகிய பருவஇதழ்களின் கட்டுரைகளுக்காக, இலங்கைப் பருவவெளியீட்டுக் கட்டுரைச் சுட்டி

⟹ தொடர்புகளுக்கு :

இலங்கைத் தேசிய மத்திய நிலையம்
இல. 14, சுதந்திர வழி,
கொழும்பு - 07.

# NATIONAL LIBRARY NEWS

## 12th Anniversary of National Library and Documentation Centre (NLDC)

A series of seminars on 'Library Automation' was held from 7-24 May, 2002 at the National Library & Documentation Services Board to mark the 12th anniversary of NLDC. Apart from that some religious activities and an exhibition of Library software were held to mark this event.

The seminar series on Library Automation consisted of 12 sessions at which different aspects of the themes were discussed in detail. Eminent professionals in the LIS & ICT and other related fields participated as resource persons at those sessions. The followings are the themes of 12 sessions.

- Seminar 1 : Digital Challenge 07.05.2002
- Seminar 2 : Public Library Forum 08.05.2002
- Seminar 3 : School Library Forum 09.05.2002
- Seminar 4 : Special Library Forum 10.05.2002
- Seminar 5 : Library Software 14.05.2002
- Seminar 6 : Higher Education Forum 15.05.2002
- Seminar 7 : National Access 16.05.2002
- Seminar 8 : Governance 17.05.2002
- Seminar 9 : Copyright & Publishing 21.05.2002
- Seminar 10 : Training 22.05.2002
- Seminar 11 : Networking 23.05.2002
- Seminar 12 : Planning 24.05.2002

The seminar papers are available for sale at the National Library & Documentation Services Board.


**The prices for these seminar papers are as follows**

- All seminar papers of 12 sessions - Rs. 2000/-
- Seminar papers of 6 sessions or 24 Seminar papers - Rs. 1000/-
- Seminar papers of 3 sessions or 12 Seminar papers - Rs. 500/-

## Seminars

An evaluation seminar for Public Librarians of Southern Province was held on 11 June 2002 at the Management Development Training Institute, Wakwella, Galle. There were 38 participants at this seminar.

## World Book & Copyright Day



One day seminar was held to celebrate the World Book & Copyright Day that was fallen on 23 April 2002, at the National Library & Documentation Services Board. Hon. W.J.M. Lokubandara, Minister of Justice, Law Reforms, National Integration & Buddha Sasana was the chief guest at this occasion. Messers Mahinda Ralapanawa & Henry Samaranayaka delivered lectures in this event. A book exhibition was also held in collaboration with the Sri Lanka Book Publishers Association and a poster depicting the theme of the day was declared open by the chief guest to mark this day.

## Book Exhibitions

Book exhibitions organised by the National Library & Documentation Services Board for the 2nd quarter of the year 2002 are as follows.

| Date | Venue |
|---|---|
| 23-27 April 2002 | - National Library and Documentation Services Board |
| 30 June 2002 to 06 July 2002 | St. Thomases College Pitakotte. |

## Grading of Libraries

Information & media unit library of Official Language Department and Dr. Richard Pathirana Public Library, Galle have been upgraded as Supra Grade Libraries.

## Training Programs



- A training program was held for Technical College Librarians in collaboration with the Department of Technical Education & Training at the NLDSB auditorium from 08 April 2002 to 11 April 2002. 24 Librarians took part in this training program.

- A Four-day training program on Library and Information Science was held for 50 Public Library Attendants of the Southern Province, from 07-10 June 2002 at the Management Development and Training Institute, Wakwella, Galle.

## Retirement
## Mr. Henry Samaranayaka

Having served 7 years for National Library and Documentation Services Board as the chairman Mr. Henry Samaranayaka has retired recently. We wish Mr. Samaranayaka a happy future.

## New Chairman for NLDSB

Prof. Tissa Kariyawasam has been appointed as the 11th chairman of the NLDSB in June 2002. He is a well-known author of books on Folklore, Buddhism and Communication. He has served as the Dean of Faculty of Arts, University of Sri Jayawardhanapura & Head of the Department of Sinhala & Communication. He also served as the chairman of Sri Lanka Rupavahini Corporation and at present he is the acting Vice Chancellor of the University of Sri Jayawardhanapura.

# OTHER NEWS

## NESEC Foundation

### Aid from Japan for Library Development

A donation of 1 million yen (Rs. 7,50,000/-) has been given by ARTIC Organisation, Japan to the NESEC Foundation, Kadawatha, Ranmuthugala to facilitate its services to users. NARA/UNESCO Organisation in Japan has also donated a sum of 0.1 million yen (Rs.75,000/-) to the NESEC foundation.

## The Bandaranaike Memorial Library & Cultural Centre

The Bandaranaike Memorial Library & Cultural Centre was declared open on 03 May 2002 at Horagolla, Attanagalla in memory of Late Prime Ministers Mr. S W R D Bandaranaika & Mrs Sirimavo Bandaranaika. This Library & Cultural Centre complex has been designed to provide many facilities eg. lending, reference, research and children's unit.

## Ginigathhena Public Library
## 'Vimansa' A new Journal

Readers Club of Public Library, Ginigathhena, Media Unit of Ginigathhena Central College and 'Vimansa' Higher Education Institute, Gampola have taken steps to publish a new journal called "Vimansa" recently. This project is being supported by the Kotmale Radio Service.

## Seethawakapura Public Library

A Shramadana campaign was launched by the staff & readers of Seethawakapura Public Library on 08th June, 2002 with an intention of repairing used books & organising its collection.

## Inauguration of New Libraries

- A new Library building was declared open in June 2002 at Dharma Dhutha Centre, Pagoda, Nugegoda in memory of its founder, Rev. Weeraketiye Kaveeshwara Thero. Funds were provided by the "Building Development Committee" of the Daham School, parents and devotees of the Dharma Dhutha Centre. The opening ceremony was presided by the Chief Incumbent of the Vidyalankara Pirivena & Chancellor of University of Kelaniya most Ven. Velamitiyawe Kusaladhamma Thero.

- Another World Bank Funded School Library Building was inaugurated at Sri Sanghamitta Maha Vidyalaya, Neligama, Kelaniya recently by the Minister of School Education Hon. Suranimala Rajapaksha.

## Remembrance Ceremony of Mr. Thilakabandu

A remembrance ceremony and an alms giving were organised in memory of late Mr. H Thilakabandu, a well known librarian in Sri Lanka recently. This was held at Ranmuthugala Maha Vihara, Kadawatha & organised by the staff & students of Dept. of Library & Information Science, University of Kelaniya.

## 112th Birth Anniversary of Martin Wickramasinghe.

A series of ceremonies were launched to commemorate the112th Birth Anniversary of the veteran author Martin Wickramasinghe from 29 to 31 May, 2002 at the National Library & Documentation Services Board.

The ceremony held on 29th May was presided by the Minister of School Education Hon. Suranimala Rajapakhsha. Minister of Justice, Law Reforms, National Integration & Buddha Sasana Hon. W J M Lokubandara was the chief guest of the ceremony held on 30th May, 2002. Book exhibitions, photograph show on Martin Wickramasinghe & Literary Conferences were among the key activities held on these days.

## Library at Regional Centre for Strategic Studies (RCSS)

A Library was inaugurated in name of late Prof. Shelton U.Kodikara, the founder director of Regional Centre for Strategic Studies recently. Minister of Human Resources Development, Education & Cultural Affairs Dr. Karunasena Kodithuwakku was the chief guest at the ceremony.

## Conferences

The special Libraries group at the Sri Lanka Library Association has held a conference on "Quality Management : Challenges of Librarians" on 29th April 2002 at the Sri Lanka Foundation Institute. Mr. D. Dharmadasa, Corporate & Business Development Manager (SGS Lanka Pvt.Ltd.) was the key resource person at this conference.


## Library Week of Eastern University

The Library week of the Eastern University, Sri Lanka was held from 21 June to 23 June 2002 at the university premises. Mr. Shri S Joshi, First secretary (Edu.) of Indian High Commission for Sri Lanka was the chief guest of the first day ceremony while Prof. M S Mookiah, Vice-Chancellor of Eastern University of Sri Lanka & Prof. S Maunaguru, Chairperson, Library Committee of Eastern University, Sri Lanka were the chief guests of Day 2 & Day 3 ceremonies respectively. Book exhibitions & Book Sale, Seminars and the inauguration of Library & Information Science ( Tamil ) course conducted by Sri Lanka Library Association at Batticaloe centre were among the some of the activities done for the Library Week. Mrs. T Arulnandhy, Actg. Librarian of the Eastern University, Sri Lanka was the organiser of the Library Week.

## ICT for Education

ICT for Education in Asia & the Pacific Website which can be accessed at http://www.unesco.org/bangkok/education/ict was launched recently in Bangkok, Thailand to provide information & resources, latest news, organizations, projects and discussions on various dimensions of ICT use in education. This website is also aimed at building an online community which will be responsible for updating and expanding its information resources through online contribution of ideas, initiatives and experiences.

## AGM of SLLA



The 42nd Annual Sessions and Annual General Meeting of the Sri Lanka Library Association (SLLA) were held on 28 June 2002 at the Galadari Hotel, Colombo. Minister of Economic Reforms, Science & Technology, Hon. Milinda Moragoda was the Chief Guest while Mr. Susil Siriwardena was the Guest of Honour who delivered a Lecture titled "New Vision and Role of Librarians & Information Specialisits".

# තක්සිලා පාසල් පුස්තකාල මෘදුකාංගය

එන්.යූ.යාපා
හිටපු පුස්තකාලයාධිපති
අන්තර්ජාතික ජල කළමනාකාරිත්ව ආයතනය

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පාසල් පුස්තකාල ප්‍රවර්ධනය පිළිබඳව දැන් දැඩි අවධානයක් යොමු වී ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය ප්‍රමුඛ ආයතන ගණනාවක් මේ පිළිබඳ විවිධ කාර්යයන් හි නියුතු වී සිටී. ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය, පුස්තකාල හා තොරතුරු විද්‍යා ජාතික ආයතනය පාසල් පුස්තකාල ප්‍රවර්ධනය අරමුණු කොට ගෙන විවිධ වැඩ සටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

පාසල් පුස්තකාල ප්‍රවර්ධනයේ දී පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබඳ විශේෂ අවධානයක් යොමුවිය යුතුව ඇත. පාසල් පුස්තකාල පරිහරණය කරන ගුරු සිසු දෙකොට්ඨාශයට ම වඩාත් කාර්යක්ෂම හා ඵලදායී ලෙස දැනුම ලබා දීම සඳහා පරිගණක හා සන්නිවේදන තාක්ෂණය යොදා ගත යුතු බව පිළිගත් කරුණකි. පුස්තකාලයක් තුළ තොරතුරු භාවිතය දෙයාකාරයකට සිදුවිය හැකිය. බාහිර තොරතුරු සැපයීම හා අභ්‍යන්තර තොරතුරු සැපයීම මේ දෙයාකාරයයි. බාහිර තොරතුරු චුම්බක තැටි හෝ සංයුක්ත තැටි මගින් ලබා ගෙන පාඨකයාට ඉදිරිපත් කිරීම හෝ අන්තර්ජාලය මගින් ලබා ගෙන පාඨකයාට යොමු කිරීම පළමු ආකාරයයි. මෙහි දී පුස්තකාල විසින් කරනුයේ මෙම මාධ්‍යයන් ක්‍රමවත්ව පුස්තකාල තුළ ගබඩා කොට ඒවා අවශ්‍ය පරිදි පරිහරණය සඳහා පාඨකයන්ට පහසුකම් සැලසීමයි. මෙම මාධ්‍ය තුළ අන්තර්ගතව ඇති තොරතුරු ඒ ඇති සැටියෙන් ම පාඨකයාට ලබා දීම සිදු කෙරේ. පුස්තකාලයාධිපතිගේ කාර්ය භූදෙක් තොරතුරු භාවිතය සඳහා පහසුකම් සැලසීමයි.

දෙවැනි ක්‍රමය නම් අභ්‍යන්තර තොරතුරු සැපයීමයි. බාහිරව ලබා ගන්නා තොරතුරු මෙන් ම අභ්‍යන්තරව උපදවන තොරතුරු ක්‍රමවත්ව විශ්ලේෂණය කොට පාඨකයන්ට ගැලපෙන ආකාරයට සංවිධානය කොට විධිමත් ව ගබඩා කරනු ලබයි. තොරතුරු වහා සොයා ගැනීමට උපකාරී වන තොරතුරු මෙවලම් නිර්මාණය කරනු ලබයි. තොරතුරු විශ්ලේෂණය කිරීම, ඇගයීම, ප්‍රතිඇසුරුම, ගවේශනය, ගබඩාකරණය, සංසරණය ආදී කාර්යයන් නිසි පරිදි ඉටු කිරීම සඳහා පුස්තකාල විද්‍යාව පිළිබඳ වෘත්තීය දැනුමක් තිබිය යුතුය.

මේ නිසා පාසල් පුස්තකාල කාර්යක්ෂමව දැනුම බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වෘත්තීය පුහුණුව ලැබූ පුස්තකාලයාධිපතීන් අවශ්‍ය වේ. බාහිරව ලැබෙන තොරතුරු ඍජුව සැපයීම මගින් විශේෂයෙන් පාසල් සිසුන්ට ප්‍රයෝජනයක් ඇති නොවේ. බාහිරව ලබා ගන්නා තොරතුරු පාසල් සිසුන්ට ගැලපෙන ලෙස නැවත සකස් කිරීම හා අවශ්‍ය විටෙක වහා ලබා ගත හැකි ලෙස ලේඛනගත කිරීම පාසල් පුස්තකාලයාධිපති විසින් සිදු කළ යුතු වේ.

තොරතුරු ප්‍රතිඇසිරීම, ක්‍රමවත් ව ගබඩා කිරීම, ගවේශනය හා නිසිපරිදි බෙදා හැරීම සඳහා පරිගණක හා සන්නිවේදන තාක්ෂණය කාර්යක්ෂම ව යොදා ගත හැක. මේ සඳහා සුදුසු මෘදුකාංග භාවිත කළ හැකි පුහුණු පුස්තකාලයාධිපතීන් අත්‍යවශ්‍ය වේ.

## ස්වයංක්‍රීයකරණය

පුස්තකාල ස්වයංක්‍රීයකරණය කෙරෙහි බලපාන සාධක ගණනාවකි. මෙම සාධක පාසල් පුස්තකාල පමණක් නොව ඕනෑම පුස්තකාල වර්ගයක් ස්වයංක්‍රීයකරණය සඳහා බලපානු ලබයි. පුස්තකාල ස්වයංක්‍රීයකරණය පිළිබඳව කරණු ලැබූ සමීක්ෂණවලින් හෙළි වී ඇති සාධක ගණනාවක් මෙහි දී සිහිපත් කළ යුතුව ඇත. ඒ සඳහා බලපාන සාධක ලෙස හඳුනා ගෙන ඇත්තේ පහත සඳහන් ඒවාය.

(අ) මුදල් ප්‍රතිපාදන නොමැති වීම.
(ආ) පුහුණු සේවකයන් නොමැති වීම.
(ඇ) සුදුසු මෘදුකාංග නොමැති වීම.
(ඈ) කළමනාකාරිත්වයේ නිසි අවධානය නොලැබීම.

පාසල් පුස්තකාල ප්‍රවර්ධනය කෙරෙහි විශේෂ අවධානයක් යොමු වී ඇති මේ අවධියේ දී ඉහත සඳහන් (අ) සහ (ඈ) යන බාධක ඉවත් ව ඇතැයි සැළකිය හැකිය. පුස්තකාල ප්‍රවර්ධනය සඳහා රජය හා රාජ්‍ය නොවන සංවිධාන මුදල් ලබා දීම කරනු ලබයි. පුස්තකාල ස්වයංක්‍රීයකරණය

සඳහා මුදල් ප්‍රතිපාදනයට බලධාරීන් දැන් පැකිලීමක් නොදක්වයි. මෙය පුස්තකාල ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ඇති වී තිබෙන සුබදායී වාතාවරණයකි. මේ නිසා මුදල් නොමැතිවීම හා කළමනාකාරිත්වයේ නිසි අවධානය යොමු නොවීම යන බාධක සැහෙන දුරට ඉවත් ව ඇති ලෙස සැළකිය හැකිය.

මේ අනුව පාසල් පුස්තකාල ස්වයංක්‍රියකරණ කෙරෙහි බලපාන ප්‍රධාන බාධක වන්නේ නිසි මෘදුකාංගයක් නොමැති වීම හා නිසි පුහුණුවක් ලැබූ පුස්තකාලයාධිපතීන් විරල වීම යන සාධකය බව පෙනී යයි.

මෙකී බාධක ඉවත් කිරීම කෙරෙහි බලපාන කරුණු ගණනාවකි. ඒවා නම්;

✸ **පුස්තකාල මෘදුකාංග මිල අධික වීම .**

මෘදුකාංගයක් ප්‍රතිග්‍රහණය කිරීම සඳහා ක්‍රම දෙකක් භාවිත කළ හැක. පුස්තකාලය විසින් එය නිර්මාණය කිරීම හෝ පූර්ණ නිර්මිත මෘදුකාංගයක් මිලට ගැනීමයි. මෘදුකාංගයක් නිර්මාණය කිරීමේ ලාභදායී ක්‍රමය වනුයේ දත්ත සමුදා කළමනා පද්ධතියක් ආධාර කර ගැනීමයි. මේ සඳහා පද්ධති නිර්මාණය මෙන් ම දත්ත සමුදා කළමනාකරණ පද්ධති පිළිබඳ දැනුමක් තිබිය යුතු ය.

දෙවැනි ක්‍රමය වනුයේ පූර්ණ නිර්මිත මෘදුකාංගයක් මිලට ගැනීමයි. මෙබඳු මෘදුකාංග කිහිපයක් වෙළඳපලට හඳුන්වා දී ඇතත් ඒවායේ මිල අධික වීම නිසා පාසැල් පුස්තකාලවලට ඒවා ප්‍රතිග්‍රහණය කිරීම අතිශයින් දුෂ්කර කාර්යයක් වී තිබේ.

✸ **පුස්තකාල මෘදුකාංග සංකීර්ණවීම**

මෘදුකාංගයක් මගින් ප්‍රතිග්‍රහණය, සූචිකරණය, අනුක්‍රමණිකාකරණය, ග්‍රන්ථ සංසරණය, සඟරා පාලනය, ප්‍රවර්තන සාවධාන සේවා ආදී පුස්තකාල කාර්යයන් ඉටු කළ හැකි විය යුතුය. මෙහිදී දත්ත පුනර් ආදානයෙන් තොරව භාවිත කළ හැකි විය යුතුය. ආදානය කරනු ලබන දත්ත විවිධ කාර්යයන් ඉටු කිරීම සඳහා පද්ධතිය තුළ හුවමාරු විය යුතු ය. මෙබඳු මෘදුකාංග. සංයුක්ත මෘදුකාංග ලෙස හඳුන්වනු ලබයි. උදාහරණයක් වශයෙන් සංයුක්ත මෘදුකාංගයක් මගින් කිසියම් පොතක් ප්‍රතිග්‍රහණයට අදාළ දත්ත ආදානය කළ විට. ඒවා සූචිකරණය, අනුක්‍රමණිකාකරණය, සංසරණය, ප්‍රවර්තන සාවධාන සේවා ආදී කාර්යයන් සඳහා ද යොදා ගත හැකි වේ. සංයුක්ත මෘදුකාංග සංකීර්ණ ස්වභාවයකින් යුක්ත බැවින් ඒවා භාවිතය පිළිබඳ මනා පුහුණුවක් ලැබිය යුතු වේ.

✸ **පුස්තකාල මෘදුකාංග නඩත්තුව දුෂ්කර වීම**

මෘදුකාංගයක් භාවිත කිරීමේ දී විවිධ ගැටලු පැන නැගේ. ඒ මගින් නිර්මාණය කරනු ලබන දත්ත සමුදාවල විවිධ දෝෂ ඇතිවිය හැක. මෙවා මෘදුකාංගයේ ඇතිවන අනපේක්ෂිත විපර්යාස නිසා හෝ දෘඩාංගවල දෝෂ නිසා සිදුවිය හැකිය. මෙබඳු අවස්ථාවල මෘදුකාංග යථා තත්වයට පත් කිරීම සඳහා පුහුණුව ලත් පිරිසක් අවශ්‍ය වේ. වාණිජ මෘදුකාංග මිලට ගැනීමේ දී ඇති කර ගන්නා නඩත්තු ගිවිසුම් අනුව මෘදුකාංග සැපයුම්කරු මෙකී දෝෂ නිවැරදි කිරීමට බැඳී සිටී. මෘදුකාංගයක් මිලට ගැනීමේ දී පුස්තකාල විසින් මේ කරුණ පිළිබඳ අවධානය යොමු කළ යුතු වේ. වාණිජ මෘදුකාංග පොදු භාවිතය සඳහා නිර්මාණය කරනු ලැබූ ඒවා බැවින් ඒවා ශ්‍රී ලංකාවේ පුස්තකාලවලට ගැලපෙන ලෙස විශේෂයෙන් සකස් විය යුතුය. වාණිජ මෘදුකාංගයක් තමන්ට ගැලපෙන ලෙස සංශෝධනය කිරීමට පුස්තකාලවලට අවකාශ නොලැබේ.

## තක්සිලා මෘදුකාංගය

තක්සිලා මෘදුකාංගය නිර්මාණය කරනු ලැබුයේ ඉහත කී කරුණු සැලකිල්ලට ගනිමිනි. එය 2002 පෙබරවාරි 1 දින ජාතික විද්‍යා පදනම මගින් සංවිධානය කරනු ලැබූ විද්‍යා පුස්තකාලයාධිපතීන්ගේ සමුළුවක දී හඳුන්වා දෙනු ලැබීය. ඉන් අනතුරුව 2002 පෙබරවාරි 13 දින ජාතික පුස්තකාලය හා ප්‍රලේඛන මධ්‍යස්ථානය සංවිධානය කළ කොළඹ දිස්ත්‍රික්කයේ පාසැල් පුස්තකාලයාධිපතීන්ගේ වැඩමුළුවක දී නැවත සනිදර්ශනය කරන ලදී.

තක්සිලා පාසැල් මෘදුකාංගය අරමුණු දහයක් පදනම් කරගෙන නිර්මාණය කරන ලදී.

★ **සාමාන්‍ය පාසැල් පුස්තකාලයකට ගෝචර වන මිලකට සැපයිය හැකි වීම.**

දැනට වෙළඳපොලෙහි පවතින පුස්තකාල මෘදුකාංගවල මිල හා සංසන්දනය කළවිට තක්සිලා මෘදුකාංග මිලෙන් ඉතා අඩු වේ.

★ **පාසැල් පුස්තකාල මගින් ඉටු කෙරෙන ප්‍රධාන කාර්යයන් ආවරණය කිරීම.**

තක්සිලා මෘදුකාංගය මගින් පුස්තකාලයේ සූචිය පවත්වාගෙන යාම පමණක් නොව ග්‍රන්ථ සංසරණය හා සාමාජිකයන් පිළිබඳ තොරතුරු ගබඩා කිරීම හා සමුද්ධරණය සඳහා පහසුකම් සළසා ඇත. ග්‍රන්ථයක් පුස්තකාලය සතුව තිබේ ද පමණක් නොව එය බැහැර දී තිබේ ද, කී වරක් බැහැර දී තිබේ ද, එය ලබා ගෙන ඇත්තේ කවුරුන් විසින් ද, එම පොත නිර්දේශ කර ඇත්තේ කුමන ශ්‍රේණි සඳහා ද, එය මිලට

ගනු ලැබුවේ කුමන සැපයුම්කරුවෙකුගෙන් ද, ඒ සඳහා ගෙවනු ලැබූ මිල කොපමණ ද ආදී තොරතුරු ලබා ගත හැකි වේ.

★ **එකම දත්තය කිහිපවරක් ඇතුළත් කිරීමෙන් වැළකීම**

මෙය පෙර කී පරිදි සංයුක්ත මෘදුකාංගයක ලක්ෂණකි. ශිෂ්‍යයෙකු පිළිබඳ දත්ත වරක් ඇතුළත් කළ පසු ග්‍රන්ථ සංසරණයේ දී එය නැවත ඇතුළත් කළ යුතු නොවේ. සැපයුම්කරුවෙකු පිළිබඳ දත්ත වරක් ඇතුළත් කළ පසු ග්‍රන්ථ මිලට ගැනීමේ දී එම තොරතුරු නැවත ප්‍රවිෂ්ඨ කළ යුතු නොවේ.

★ **ස්වයං පුහුණුව මගින් භාවිත කළ හැකි වීම**

තක්සිලා මෘදුකාංගය භාවිත කිරීම පහසු වන ආකාරයට නිර්මාණය කර ඇත. සෑම කාර්ය පත්‍රිකාවක ම දත්ත ප්‍රවිෂ්ඨ කිරීම පිළිබඳ උපදෙස් ලබා දී තිබේ. මෘදුකාංගය භාවිත කරීම පිළිබඳ උපදෙස් සංග්‍රහයක් මෘදුකාංගය සමග ලැබේ. මෙය විද්‍යුත් ග්‍රන්ථයක් ලෙස ලැබෙන බැවින් තක්සිලා මෘදුකාංගය භාවිත කරන අතර එය පරිගණකය මගින් පෙරලා බැලිය හැකි වේ. මෙම සංග්‍රහයේ දත්ත ප්‍රවිෂ්ඨ කිරීම, සංශෝධනය, වාර්තා මුද්‍රණය, තොරතුරු ගවේශනය ආදී කාර්යයන් පියවරෙන් පියවර විස්තර කර ඇත.

පුස්තකාල කටයුතු පිළිබඳ දැනුමක් හා පරිගණක පරිහරණය පිළිබඳ මූලික අවබෝධයක් ඇති ඕනෑම අයෙකුට තක්සිලා මෘදුකාංගය පහසුවෙන් පරිහරණය කළ හැකිය.

★ **මෘදුකාංගය පිහිටුවීම හා නඩත්තුව පහසුවීම**

තක්සිලා මෘදුකාංගය පුස්තකාලයාධිපති විසින් තම පරිගණකයේ පිහිටුවීම කළ යුතු වේ. මේ සඳහා කළ යුත්තේ ඉතා සරල කාර්යයන් කිහිපයකි. වින්ඩෝස් මෘදුකාංගය පිළිබඳ මූලික අවබෝධයක් තිබීම ප්‍රමාණවත් ය. තක්සිලා මෘදුකාංගය ඩිස්කට් දෙකක අන්තර්ගත කර ඇති අතර ඒවායේ ඇති ගොනු තම පරිගණකයට පිටපත් කිරීමෙන් මෘදුකාංගය පිහිටුවිය හැක. මෘදුකාංගය නඩත්තුව සඳහා කළ යුත්තේ සරළ කාර්යයන් කිහිපයකි.

★ **නව තොරතුරු මාධ්‍යයන් ආවරණය කිරීම**

තක්සිලා මෘදුකාංගය මගින් බහුමාධ්‍ය පුස්තකාලයක් පවත්වාගෙන යා හැක. ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය පිළිබඳ තොරතුරු ඇතුළත් සූචියක් පවත්වාගෙන යාම පමණක් නොව ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයන් පරිගණකය මගින් දර්ශනය කිරීම හා ශ්‍රවණය කිරීම සඳහා ද තක්සිලා යොදා ගත හැක. (මේ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.)

★ **ජාලීකරණයට උපකාරී වීම.**

තක්සිලා මගින් අන්තර්ජාලයේ තොරතුරු ලබා ගත හැකිය. පුස්තකාලයට අන්තර්ජාල පහසුකම් තිබේ නම් පුස්තකාල සූචිය (විශේෂයෙන් බහුමාධ්‍ය සූචිය) අන්තර්ජාලයට සම්බන්ධ කොට තොරතුරු ලබා ගත හැකි වේ. විද්‍යුත් තැපැල් පහසුකම් තිබේ නම් පුස්තකාල තොරතුරු විද්‍යුත් තැපැල් මගින් විවිධ ආයතන හා පුද්ගලයන්ට යැවිය හැකිය. ( මේ පිළිබඳ විස්තර පහත දක්වා ඇත.)

★ **පුස්තකාල පරිහරණය පිළිබඳ තොරතුරු සැපයීම**

තක්සිලා මෘදුකාංගය ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරුවලට පමණක් සීමා නොවේ. ශිෂ්‍යයන්ගේ කියවීමේ රුචිකත්වය ඇගයීම සඳහා අවශ්‍ය දත්ත එමගින් ලබා ගත හැකිය.

★ **වෙනත් පුස්තකාල සමග තොරතුරු හුවමාරු කර ගැනීමට උපකාරී වීම**

පුස්තකාල සම්පත් පිළිබඳ තොරතුරු වෙනත් පුස්තකාලයකට ලබා දිය හැක. මෙය මුද්‍රිත මාධ්‍යයෙන් හෝ විද්‍යුත් මාධ්‍යයෙන් කිරීමට පුළුවන. තක්සිලා මෘදුකාංගය භාවිත කරන වෙනත් පුස්තකාල සමග පහසුවෙන් තොරතුරු හුවමාරු කළ හැකිය. උදාහරණයක් වශයෙන් කොට්ඨාශ හෝ මණ්ඩල පදනමෙන් ඒකාබද්ධ සූචි පවත්වාගෙන යාමට තක්සිලා උපකාරී වේ.

★ **පුස්තකාලයේ අවශ්‍යතාව පරිදි මෘදුකාංගය සංශෝධනය කිරීමට අවකාශ සැලසීම**

තක්සිලා වෙනත් වාණිජ මෘදුකාංගවලට වඩා විශේෂ වන්නේ එය සංශෝධනය කිරීමට පුස්තකාලයාධිපතීන්ට අවසර ලැබීම නිසාය. තක්සිලා මෘදුකාංගය යුනෙස්කෝව විසින් සම්පාදනය කරනු ලැබූ විනයිසිස් මෘදුකාංගය පදනම් කොට නිර්මාණය කර ඇති බැවින් විනයිසිස් පිළිබඳ දැනුමක් ඇති අයට එහි වෙනස්කම් කළ හැකි වේ. සනිදර්ශන ආකෘතිවල වර්ණය, අකුරු හැඩය, අකුරු ප්‍රමාණය, අන්තර්ගත දත්ත සංඛ්‍යාව ආදිය පහසුවෙන් වෙනස් කළ හැකිය.

## ස්වයංක්‍රියකරණ සේවා

විනයිසිස් දත්ත සමුදා කළමනාකරණ පද්ධතිය පදනම් කරගෙන නිර්මාණය කරනු ලැබූ හෙයින් එහි ඇති සියලුම හැකියාවන් තක්සිලා මෘදුකාංගය උරුම කරගෙන සිටී. තක්සිලා මගින් පහත සඳහන් සේවාවන් සැපයේ.

❖ ග්‍රන්ථ සූචිය

ග්‍රන්ථ, සඟරා, සිතියම් ඇතුළත් සූචියක් නිර්මාණය කිරීම තක්සිලා මෘදුකාංගය සපයන ප්‍රධාන සේවාවකි. ග්‍රන්ථයක කර්තෘ, ග්‍රන්ථ නාමය, සංස්කාරක, ප්‍රකාශක, ප්‍රකාශන ස්ථානය, ග්‍රන්ථ මාලාව, පිටු සංඛ්‍යාව, ප්‍රමාණය, ඇමතුම් අංකය, ප්‍රවේශ අංකය, විෂය මූලික පද ආදිය පමණක් නොව එය අරමුණු කළ පාඨක වර්ෂය, එය නිර්දේශිත ශ්‍රේණිය ආදී තොරතුරු ද ලබා ගත හැකිය. ග්‍රන්ථයක සූචි සංලේඛය පමණක් නොව සංසරණය සඳහා භාවිත කරන පොත් තුණ්ඩුව ද මුද්‍රණය කළ හැකිය.

❖ බහුමාධ්‍ය සූචිය

ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය ඇතුළත් සංවාදශීලී බහුමාධ්‍ය සූචියක් නිර්මාණය කළ හැකි වීම තක්සිලා මගින් සලසා ගත හැකි මහඟු සේවයකි. සංවාදශීලී සූචියක් කියවීමට පමණක් නොව එහි අන්තර්ගතය දර්ශනය කිරීමට හෝ ශ්‍රවනය කිරීමට හැකි වේ. ජායාරූප, සිතියම්, ගීත ආදිය සූචියට ඇතුළත් කළ හැකි බැවින් ඒවා ගවේශනය කළ පසු මෘදුකාංගය මගින් ශ්‍රවනය කිරීම හෝ දර්ශනය කිරීම කළ හැකිය. උදාහරණයක් වශයෙන් ගීතයක් ගවේශනය කොට සමුද්ධරණය කළ වහාම එය වාදනය කළ හැකි වේ.

❖ ආයතන නාම සංග්‍රහය

ආයතන නාම සංග්‍රහයක් පවත්වා ගෙන යාමට තක්සිලා මෘදුකාංගය උපකාරී වේ. ආයතන පිළිබඳ විස්තරවලට අමතරව එහි ජායාරූප, වෙබ් අඩවිය, විද්‍යුත් තැපැල ඇතුළත් කළ හැකි බැවින් ගවේශනයකින් පසු ආයතනයේ ජායාරූපයක් දර්ශනය කිරීම, එහි වෙබ් අඩවියට පිවිසීම, එයට විද්‍යුත් තැපැලක් යැවීම ආදී කාර්යයන් ඉටු කළ හැකි වේ.

❖ ශිෂ්‍ය නාමලේඛන

ශිෂ්‍යයන් පිළිබඳ විවිධ තොරතුරු ගබඩා කළ හැකි වේ. ඔවුන්ගේ නම ලිපිනය පමණක් නොව ශ්‍රේණිය, පන්තිය, උපන් දිනය, ජාතික හැඳුනුම්පත් අංකය, විනෝදාංශ, හදිසි දුරකථන අංක ගබඩා කළ හැකි වේ. මේ නිසා විවිධ ලේඛන මුද්‍රණය කළ හැකිය. ශිෂ්‍ය නාම ලේඛන අකාරාදී පිළිවෙලට පමණක් නොව ශ්‍රේණිය, පන්තිය, වයස අනුව ද පිළියෙල කළ හැකි වේ.

❖ ගුරු නාම ලේඛනය

ගුරුවරුන් පිළිබඳ නාමය, දුරකථන අංකය, ලිපිනය පමණක් නොව ඔවුන්ට අදාළ පන්තිය, ශ්‍රේණිය, විෂය යන කරුණු ද ඇතුළත් කළ හැකි වේ. මේ නිසා ගුරු නාම ලේඛනයක් අකාරාදී ව පමණක් නොව ශ්‍රේණිය, විෂය, පන්තිය අනුව ද පිළියෙල කළ හැකි වේ.

❖ කියවීමේ රුචිකත්වය

ශිෂ්‍යයන් කියවීම කෙරෙහි නැඹුරු කරවීමේ අවශ්‍යතාව දැන් අධ්‍යාපන විශේෂඥයන්ගේ අවධානයට යොමු වී ඇති කරුණකි. තක්සිලා මගින් මෙවැනි අධ්‍යයනයන්ට රුකුලක් ලැබේ. ශිෂ්‍යයෙකු කිය වූ පොත් ගැන දැන ගැනීම පමණක් නොව යම් පොතක් කිය වූ ශිෂ්‍යයන් පිළිබඳ තොරතුරු ද ලබා ගත හැකිය.

❖ ග්‍රන්ථ සංසරණය

ග්‍රන්ථ සංසරණ සේවා සැපයීම තක්සිලා මෘදුකාංගයේ ප්‍රධාන සේවාවකි. ග්‍රන්ථයක් නිකුත් කිරීමේ දී ඒ අවස්ථාවේ දී ශිෂ්‍යයා සතුව ඇති පුස්තකාල පොත් ගැන මෙන් ම ඒවා කල් පසු වී ඇත්දැයි දැන ගැනීම ද කළ හැකිය. ග්‍රන්ථ සංසරණය පිළිබඳ සංඛ්‍යාලේඛන ලබා ගත හැකිය. පොතක් ආපසු බාරදුන් විට එයට අදාළ සූචි සංලේඛනයන් අවලංගු කළ හැකි වේ.

❖ ප්‍රතිග්‍රහණ තොරතුරු

ප්‍රවේශ අංකය අනුව සංවිධානය කොට ප්‍රතිග්‍රහණ තොරතුරු ඇතුළත් ප්‍රතිග්‍රහණ ලේඛණයක් පවත්වා ගෙන යා හැකිය. යම් ආයතනයකින් ලැබුණු හෝ ලැබිය යුතු ග්‍රන්ථ පමණක් නොව යම් ග්‍රන්ථයක සැපයුම්කරු පිළිබඳ තොරතුරු වහා ලබා ගත හැකිය.

## දත්ත ප්‍රවිෂ්ටය

තොරතුරු පද්ධතියක් ප්‍රවර්ධනය කිරීමේ ඊට අදාළ දත්ත නිවැරදි ව ප්‍රවිෂ්ට කළ යුතු වේ. ග්‍රන්ථ, සඟරා, සිතියම්, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය, ශිෂ්‍යයන්, ගුරුවරුන්, ආයතන, ග්‍රන්ථ සංසරණය ආදිය පිළිබඳ දත්ත නිවැරදි ව ගබඩා කළ යුතු වේ. මේ සඳහා විවිධ කාර්ය පත්‍රිකා භාවිත කෙරේ. ග්‍රන්ථවල තොරතුරු ඇතුළත් කිරීමට කාර්ය පත්‍රිකා තුනක් සපයා ඇත. මූලික දත්ත පමණක් ඇතුළත් කරන්නේ නම් එය පහසුවෙන් කළ හැකි වන පරිදි කෙටි කාර්ය පත්‍රිකාවක් ද විස්තරාත්මක ඇතුළත් කිරීම සඳහා විස්තරාත්මක කාර්ය පත්‍රිකාවක් ද සපයා ඇත. මේ අනුව ශිෂ්‍යයන්, ගුරුවරුන්, බහුමාධ්‍ය, සංවිධාන, ග්‍රන්ථ සංසරණය ආදිය සඳහා විවිධ කාර්ය පත්‍රිකා සපයා ඇත.

කාර්ය පත්‍රිකාවක දත්ත ඇතුලු කරන විට ඒ සම්බන්ධ උපදෙස් ස්වයංක්‍රීය ව දර්ශනය වේ. ඇතැම් දත්ත වැරදි ලෙස ඇතුළත් කිරීම වැලැක්වීම සඳහා උපක්‍රම යොදා ඇත. එමෙන්

ම සටහන්, දත්ත තෝරා ගැනීම සඳහා ලැයිස්තු සපයා ඇත. උදාහරණයක් ලෙස වර්ග අංකය හෝ මූලික පද තෝරා ගැනීම සඳහා ලැයිස්තු ස්වයංක්‍රීයව සනිදර්ශනය කෙරේ. මෙහි දී අදාළ දත්ත මෙම ලැයිස්තුවලින් තෝරා ගත හැකිය. ප්‍රවිෂ්ට කළ දත්ත ඕනෑම අවස්ථාවක වෙනස් කළ හැකි වේ. මෙහි දී කරන ලද වෙනස්කම් අනුව අනුක්‍රමණිකාව ද ස්වයංක්‍රීයව සංශෝධනය වේ.

## වාර්තා සනිදර්ශනය

අදාළ සංලේඛ තිරය මත සනිදර්ශනය කිරීම හෝ මුද්‍රණය කිරීම සඳහා විවිධ ආකෘති භාවිත කළ හැකිය. ග්‍රන්ථ සනිදර්ශනය කිරීම සඳහා ආකෘති තුනක් සපයා ඇති අතර ශිෂ්‍යයන්, ගුරුවරුන්, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය, ග්‍රන්ථ සංසරණය, ආයතන ආදිය පිළිබඳ සංලේඛ සනිදර්ශනය සඳහා ආකෘති දෙක බැගින් සපයා ඇත.

## ගවේශනය

තක්සිලා මෘදුකාංගය පදනම් වී ඇත්තේ විනයිසිස් මෘදුකාංගය මත බැවින් විනයිසිස් සතු සියලුම ගවේශන හැකියාවන් තක්සිලා නිර්මාණයේ දී යොදා ගෙන ඇත. සරල ගවේශන පමණක් නොව පද කිහිපයක් සම්බන්ධ කර ගෙන කෙරෙන බූලියන්, ලෝපකරණ, සමීපතා, ක්ෂේත්‍ර හා පෙළ ගවේශන පහසුවෙන් කළ හැකිවේ. මේ සඳහා පද අකාරාදියෙන් පද තේරීමෙන් හෝ අවශ්‍ය ගවේශන පදය යතුරුලියනය කිරීමෙන් ගවේශන ප්‍රකාශනයක් සකස් කළ හැකි වේ.

## ගොනු සංශෝධනය

පුස්තකාලයාධිපතිගේ අභිමතය පරිදි සනිදර්ශන ආකෘති, කාර්ය පත්‍රිකා සංශෝධන හෝ අලුතින් නිර්මාණය කිරීම හෝ කළ හැකිය. මේ සඳහා පුස්තකාලයාධිපතිට විනයිසිස් මෘදුකාංගය භාවිත කිරීම පිළිබඳ මනා වැටහීමක් තිබිය යුතු වේ. තක්සිලා මෘදුකාංගයේ ප්‍රධාන වාසියක් නම් එය සංශෝධනය කිරීමට පුස්තකාලයාධිපතිට අවසර ලැබීමයි.

## මෘදුකාංගය භාවිතය

තක්සිලා ඩිස්කට් දෙකක අන්තර්ගත වේ. මේවා තම පරිගණකයේ ස්ථාපිත කිරීම ඉතා සරල ක්‍රියාවලියක් මගින් ඉටු කළ හැකිය. මෘදුකාංග සමග තක්සිලා අත්පොතෙහි විද්‍යුත් පිටපතක් ලැබේ. එය පරිගණකයේ ගබඩා කොට තබා ගැනීම හෝ මුද්‍රණය කර පොතක් වශයෙන් පරිහරණය කිරීම කළ හැකිය.

සිංහල, දෙමළ හා ඉංග්‍රීසි
භාෂාත්‍රයෙන්
ශ්‍රී ලංකාවේ ප්‍රකාශයට පත් කරන
පුවත්පත්වල ලිපි සොයා ගැනීමට
පහසු ප්‍රවේශයක්

ශ්‍රී ලංකා
පුවත්පත්
ලිපි අනුක්‍රමණිකාව

වාර්ෂික ප්‍රකාශනයකි

විමසීම් :
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික පුස්තකාල හා ප්‍රලේඛන
මධ්‍යස්ථානය
14, නිදහස් මාවත,
කොළඹ 07.

Continued from last issue

# Library & Information Education of Sri Lanka in comparison with those of other South Asian countries

Pradeepa Wijetunga
Director,
National Institute of Library & Information Science

## 3. Curriculum

### 3.1 Core courses

In Sri Lanka as well as in other South Asian countries main emphasis is laid on traditional aspects. Cataloguing and classification dominates the curriculum. Library management, information sources and services seem to be equally popular. The above tables refer only to the core courses where applicable. Though almost all the courses are designated as Library and Information Science, there is very little or no element of information science in these programmes. Any attempt at attitude changes or development of service attitude seems to be lacking throughout the region.

But it is evident from the literature that India, Pakistan and Bangladesh have realised the necessity to change. India held a seminar on (Tejomurthy 1994) this subject to discuss the future curriculum of LIS education besides, several authors (Harinarayana & Nalini, 1994, Basu & Sarkhel, 1996, Singh & Kalra, 1996) have stressed the need for change.

Several authors have commented that present courses in Bangladesh are stereotyped and less useful to cope with the existing developing situation of libraries. Jamali (1990), Haider (1995) and Kabir (1999) have commented that LIS curricula should change to incorporate the newer developments.

Lack of literature regarding this aspect in Sri Lanka and the absence of regular reviews indicate that little attention is paid to the curriculum development. But in the light of the views of experts in other South Asian countries Sri Lankan course contents must be reviewed to suit the current information needs of the country.

### 3.2 Specialisation

Analysis of course documentation revealed that, the LIS programmes in Sri Lanka concentrates on training personnel to manage a library by providing an in-depth knowledge of traditional library practices. Trainees are provided with an introductory or basic level knowledge of traditional library practices. None of the courses provide an opportunity for them to specialise in any particular field. Majumdar and Shukla (1994) observes that increasing specialisation in various fields of knowledge demands specialised service from their libraries and it has necessitated the need for specialisation in LIS education. They further mention that Masters in LIS is meant for the senior professionals; therefore it needs specialisation in various aspects. We should take examples from other South Asian countries especially from India and Pakistan where options are provided to specialise. Masters program of University of Chandighar provides a choice of bibliography and literature in humanities, social science, natural science, medical, engineering or agriculture, another opportunity is given to select either a dissertation topic or one from computer applications, operations research and systems analysis, or education for LIS. University of Karachi offers a selection of library types in the first semester and during the second semester library legislation of the chose type of library, library automation, AV materials, archives and many other options are provided.

## 3.3 Relevance and Reference to Indigenous Libraries

Indian librarianship is very much indigenous. Most of the textbooks used are by Indian authors referring to Indian libraries and Information Centres. Anglo-American books are used only to a limited extent. Pakistani LIS courses refer to Islamic and oriental topics in classification and cataloguing, Pakistani and Islamic literature and problems of Pakistani book trade. In Bangladesh, society, history and culture as well language and literature of Bangladesh are taught. This characteristic is missing in the Sri Lankan courses. SLLA three tier course refers to the use of computers in Sri Lanka, the activities of SLLA, the LEARN network, the NLDSB and the NSF. The MLS (Colombo) refers to national information systems but the students can not specialise in any of these fields. There is no reference to the ancient libraries and literature, information media, preservation of ola leaf manuscripts, nor to current librarianship, professional status of the librarian, problems faced by librarians, Sri Lankan and Buddhist literature, classification problems of these subjects etc. Textbooks used in Sri Lanka are mainly Anglo-American. Senior professionals who are active in LIS education are either trained in foreign countries or have been students of foreign trained librarians. These factors together with insufficient time for careful planning of courses may have created this void. LIS education field is not researched and courses are not properly evaluated and reviewed, these factors may have contributed to the condition to go unnoticed yet.

## 4 Curriculum vs Syllabus

"Syllabus is a unidimensional document which lists the subjects, and contents outline with broad time allocation. Curriculum is three dimensional and takes into account the needs of the students, the content and the instructional methodology". (Karisiddappa and Sangam 1994, p.36)

In the light of the above definition, the other three countries have well defined curricula, but in Sri Lanka most of the curricula are mere lists of subject headings. They show the characteristics of syllabi rather than curricula. SLLA's three-tier course defines the course content in depth without paying attention to the evaluation criteria or instructional methods. The course documentation of the Masters programs provide by-laws, assessment methods and evaluation criteria for the benefit of the students, but do not provide information on instructional methods or details of course contents other than main subject headings.

The MLS (Colombo) refers to national information systems but the students can not specialise in any of these fields. There is no reference to the ancient libraries and literature, information media, preservation of ola leaf manuscripts, nor to current librarianship, professional status of the librarian, problems faced by librarians, Sri Lankan and Buddhist literature, classification problems of these subjects etc.

## 2.8 Teaching Faculty

94% of the LIS teaching faculty in Sri Lanka are employed full time in executive posts in Library and Information Services. Teaching is only a part time commitment for them and most of them teach only 25-50 hours a year. There are only a few young professionals among the teachers, which leads to the question whether teaching is not attractive to recently qualified professionals. 84% of the teachers have achieved general education of Bachelors or Postgraduate level and 60% of the teachers have academic qualifications in LIS. 71% have professional qualifications in LIS. Mobility information of LIS teachers within next five years indicate that 16% will retire from teaching while 60% of the current teachers are hoping to engage in higher studies. (Wijetunge and Willson, 1998)

Apart from the Department of Library and Information Science, other organisations which conduct courses in LIS at present, are not in a position to employ full time staff. SLLA has no financial provision for this purpose. Faculty of Graduate Studies of University of Colombo too, has no provision for full time teachers. Under these circumstances LIS education

field in Sri Lanka largely depends upon part time staff.

Librarians in Sri Lanka are given a basic training to manage a library or information centre. The highest qualification (Masters) available to train students with this objective and the curriculum has a limited scope.

India and Pakistan had a similar teaching faculty to Sri Lanka at their initial stages. Up to the late 1950s teaching faculty in library schools of India consisted of part time teachers usually drawn from the respective universities, and the university librarian invariably functioned as the head of the library school. But the need for full time teachers was duly recognised by the UGC Review Committee in 1965. Trend over the past 20 years or so has been to employ gradually full time teachers as well as full time Heads of the library schools. UGC Panel on Library and Information Science in 1982 recommended that a university department of library science/library and information science should have adequate full time teaching staff and also a full time Head (Mangla 1994, p. 408).

Karachi Library school, which was the first started in Pakistan conducted classes with part time teachers. Other universities followed same pattern at the initial stage. However, the position changed during the past 20 years. The university librarian was the head of the respective schools until early 1970s. Yet today they are full-fledged departments. Fullbright scholarship scheme and Asia Foundation has offered them an opportunity to send prospective teachers abroad for advanced study. But still the problem is not solved, because of the vast range of subjects that need to be taught and lack of experience by teachers. It is difficult to find potential teachers with the necessary specialised knowledge partly because most Pakistani librarians received their own professional education within the country under the traditional curricula and partly because many of those who do receive a more modern professional education abroad do not return home.

Condition in Bangladesh seems to be close to that of Sri Lanka. Ahmad (1992) claims that there is a dearth of experienced, capable and competent full time teaching staff at postgraduate level. No provision is made for higher education and training facilities of teachers in library and information science. In 1959, Dhaka library school was opened with part time staff and the university librarian as the Head of the school. At present this school has one professor, four associate professors and four assistant professors, but Rajshahi University and Library Association of Bangladesh still conducts their courses with part time staff.

The nature of teaching faculty creates several problems in the LIS education field. Since almost all teachers are involved on part time basis their commitment to teaching is extremely limited. With their occupational commitments they have very limited periods for preparation. This is further aggravated by the minimal library facilities available for them, at the teaching institutions. Apart from the material gathered during their student years (which may be more than five years out dated), the teachers have limited time and resources to upgrade the knowledge. No organisation is directly responsible for their career development as teachers. There is no opportunity for continuing education as teachers either in LIS or in teaching methods.

Librarians in Sri Lanka are given a basic training to manage a library or information centre. The highest qualification (Masters) available to train students with this objective and the curriculum has a limited scope. Those who do well in the local courses are sometimes taken as teachers for the same course. This makes the LIS education a closed system preventing it from expanding its horizon of variety. If the teacher is truly dedicated and possesses inherent teaching ability only, the students will gain. Bonn (1968) commenting on this part time nature of Indian teaching faculty in the early days has commented that "Running a full time library school entirely with part time staff of teachers-cum-librarians not only disparage Indian librarianship and downgrade library education but also defrauds library users of proper services and gives library school students something less than their moneys worth." (Bonn 1968, p.5) This statement is true regarding the present LIS teaching faculty of Sri Lanka.

Though the importance of having a full time teaching faculty in Sri Lanka is stressed, India has seen the adverse effects of the full time faculty. Kaula points out that "It has resulted that full time faculty members have kept themselves aloof from the practical and clinical work in a library, thereby they have become theoreticians. Similarly experienced working librarians have been kept out from the teaching opportunity that could benefit the students." (Kaula 1988, p.174.)

Teachers moved away from the practical real world can design a curriculum to produce librarians who do not match the existing library needs. Therefore there should be a balance of full time teachers as well as practising librarians. IFLA standards for library schools confirm this by saying that, some members of the staff may be practising librarians who teach in the programme on a part time basis. This is desirable as a means of amplifying the range of full time staff, and as a means of giving current, practical viewpoints to the teaching activity. However, a certain proportion of staff should be holders of full time teaching appointments with no work outside the school (IFLA 1976, p.217). Later revision also stresses the significance of a balance of part-time and full-time staff. (Daniel, Lazinger and Harbo).

## 2.9 Research and Publications

India plays an active role in this sphere than the other South Asian countries. Ranganathan alone has contributed about 50 monographs and 2000 articles while hundreds of monographs on all LIS topics are published in English as well as in native languages. There are about 20 recognised journals published. LIS education is well represented in the literature. Several national and international seminars have been held in India covering LIS education in general, teaching and evaluation methods, manpower developments, national policy for LIS education and restructuring of curricula. Also a considerable amount of research is being carried out at higher degree level.

Pakistan, though not as much as India, contributes to the LIS literature by way of higher degree research and a small number of monographs. Journal of the Pakistan Library Association carries articles of high academic standard.

Contribution to LIS research and literature from Bangladesh is less than from India and Pakistan, but there are contributions to international journals by Bangladeshi authors. A few textbooks are published in English. A number of higher degree level researches have been carried out on various aspects of Librarianship but they are not adequate.

Research and publication activities are rather limited in Sri Lanka. National Library and Documentation Services Board publishes a quarterly journal and the SLLA and the University Librarians' Association publishes two journals. Since the commencement of Masters degrees a number of research work has been carried out but these are not adequate at all. Publication of monographs in native languages is limited to a handful and there is a dearth of study material for students.

## 2.10 National Level Planning

As in most of the other aspects, India has taken prominence in this aspect too. India has recognised the importance of national level planning. So far, no LIS education policy has been established, but there have been several other activities. Universities have based their LIS programmes on "Library science in Indian universities", The 1965 report of the University Grants Commission (UGC). Subsequently UGC Panel on Library and Information Science gave its recommendations on syllabi, teaching faculty, physical facilities etc. In 1988, Inter Agency Working Group of UGC submitted a report titled "Development of Information and Library Network (INFLIBNET)" which provides guidelines for UIS programmes. In 1990 UGC formed a curriculum development committee to maintain uniformity of LIS education in the country. A considerable amount of national level activities exist although Indian LIS educators would like to see more.

National level planning is available in Pakistan in a lesser degree. In 1987 UGC has prepared a common curriculum in LIS for Bachelors and Masters programmes. Pakistan Library Association,

in 1972, has set standards for certificate level courses. A five-year professional development programme has been conceived as a joint project between British Council and UGC.

The Bangladesh report of the Education Commission of 1974 refers not only to the establishment of various types of libraries but also to the LIS education. Recommended that LIS departments should be established in the three general universities and a training institute for pre-graduate level courses. A national seminar was held in 1993 on "preparing the libraries and librarians of Bangladesh for the 21st century", by the Library Association of Bangladesh.

National level planning of LIS education is absent in Sri Lanka. Sri Lankan UGC has provided no support at all apart from authorising the commencement of courses in the universities. National Library Services Board act of 1970 and the SLLA (incorporation) Act of 1974 are two legislation which support LIS education. An expert was invited by the Ministry of Education and Higher Education in 1983 to assess the LIS education system and make recommendations, but none of these recommendations are implemented still. A World Bank team has studied the LIS education system in 1994 and has recommended establishment of National Institute of Library and Information Science (NILIS) with the special objective of training school librarians. This was established in 1999 and hopefully national level planning of LIS education in Sri Lanka will be undertaken by NILIS.

## 3. Conclusion

There are more likenesses than differences in the LIS education system of the South Asian countries. They all share the problems of limited teaching faculty, lack of training facility for teachers, poor quality of students, lack of resources, absence of manpower surveys, limited or absent national level planning and lack of recognition. Variation lies in the recognition of these problems and attempts made to overcome them. India takes prominence in this by recognising the importance of libraries and librarians for the development of the country. Besides, the professionals provide a good leadership in upgrading the LIS profession. This characteristic is apparent in Pakistan and Bangladesh in a lesser degree.

Sri Lanka has done very little so far, to eliminate and overcome the problems related to LIS education, although professionals are aware of them. Lack of effort from the LIS professionals (most probably as a result of part-time nature of LIS educators) has contributed to the absence of support from government authorities. Sri Lankan librarians will lose their place to the other information-oriented professionals if they are not educated to serve the information user of the present. Time to build up a full-time core of LIS educators to protect the education and training of the LIS professionals.

### *References*


Ahmad, Nasiruddin (1988). Library education in Bangladesh needs modernisation. Journal of Library and Information Science (India), 13(2), pp.143-152.

Ahmad, Nasiruddin (1992). Library education and training its present position and pattern in Bangladesh. In formation and International Library Review, 24(1), pp.91-99.

Ahmad, N. (1981). Education for librarianship in Bangladesh. International Library Review. 13(1), pp.103-115.

Bansal. G.C. and Tikku, U.K. (1988). Library science education in Panjab. International Library Review, 20(3), pp.395-403.

Basu, Asok and Sarkhel, J.K. (1996). Curriculum development in library and information science: analysis of UGC report. Herald of Library Science. 35(1-2), pp. 78-85

Bonn, George S. (1968). The state of Library education in India Annals of Library Science and Documentation, 15(2), pp.57-75.

Daniel, Evelyn, Lazinger, Susan and Harbo, Ole (2000). Guidelines for Library/Information programs for discussion. Paper presented at 66th IFLA General Conference, Jerusalem, August 2000.
(URL http://www.ifla.org/Ivifla66/papers/060-161e.htm)

Haider, S.J. (1995). Library and Information Science curriculum a futuristic approach. Pakistan Library Bulletin, 26(1) pp.i-ii.


- Harinarayana, N. S. and Nalini, K. R. (1991). Changing dimensions of libraries and their implications to library science education in India. Herald of Library Science, 33(1/2), pp.11-18
- IFLA. Section of Library Schools. (1976). Standards for library schools, 1976. IFLA Journal, 2(4), pp.209-223.
- Irving, Ann (1983). Education and training for library and information work. Colombo: Sri Lanka National Library Services Board.
- Jamali, Hassan (1990). Needs and importance of fieldwork/practical training for future librarians in Pakistan. Pakistan Library Bulletin, 21 (3/4), pp.23-27.
- Kabir,
- Kandiah, P. (1958). Report of the commission on the Colombo Municipal Public Library. Colombo: Municipal Council.
- Karisiddappa, C.R. and Sangam, S.L. (1994). Library and information science curriculum: some basic considerations IN Restructuring of Library and information science. Ed. By A. Tejomurthy. New Delhi. Concept, 1994. pp. 35-42.
- Kaula, P.N. (1988). Hundred years of library and information science education. Herald of Library Science, 27(3/4), pp.171-177.
- Khurshid, Anis (1977). Library education in Pakistan. In: Kent, Allan, ed. Encyclopedia of Library and Information Science New York: Marcel Dekker.21, pp.282-299.
- Khurshid, Anis (1987). Library education in Pakistan. Library Times International 4(3), pp.46; 48.
- Majumdar, K.J. and Shukla, K.H. (1994). Need of specialisation at MLS level IN Restructuring of Library and information science. Ed. By A. Tejomurthy. New Delhi. Concept, 1994. pp 151-156.
- Mangla, P.B. (1994). Library and Information Science education in South Asia India, Pakistan, Bangladesh and Sri Lanka. Education for Information, 12(4). pp. 399-427.
- Sing, Jagtar and Kalra, H.P.S. (1997). Restructuring of MLISc course: issues and implicatrions. IASLIC Bulletin, 41(1), pp. 39-46.
- Tejomurthy (1994). Restructuring of Library and information science. New Delhi. Concept.
- Wijetunge, Pradeepa and Willson, Jonathan (1998). Descriptive survey of Library and Information Science Education Personnel in Sri Lanka. Asian Libraries, vol.7, pp.105-114.


## ජාතික ඒකාබද්ධ සූචිය

ජාතික ඒකබද්ධ සූචිය සම්පාදනය කිරීම හා පවත්වාගෙන යාම ජාතික පුස්තකාලයේ ප්‍රධාන කාර්යයකි.

ශ්‍රී ලංකාවේ සියලුම ප්‍රධාන පුස්තකාලවල ඇති පොත්පත් හා පුස්තකාල ද්‍රව්‍ය පිළිබඳ තොරතුරු එක් ස්ථානයකින් පාඨකයන් හට ලබා දීම ජාතික ඒකාබද්ධ සූචියේ මූලික අරමුණ වේ.

තොරතුරු කරා ළඟාවෙන පාඨකයන් හට පහසු ප්‍රවේශයක් සපයමින් අවශ්‍ය තොරතුරු ඇත්තේ කුමන පුස්තකාලයේ ද යන්න පිළිබඳ විස්තර ජාතික ඒකාබද්ධ සූචියෙහි අන්තර්ගත වේ. ජාතික පුස්තකාලයට පැමිණෙන පාඨකයන්ට අවශ්‍ය තොරතුරු ජාතික පුස්තකාලයේ නොමැති නම් ඒවා ඇත්තේ කුමන පුස්තකාලයේ ද යන්න



දැන ගැනීමට අදාළ තොරතුරු මෙමගින් ලබා ගත හැකි වේ. වර්ෂ 1986 දී කුඩා ව්‍යාපෘතියක් වශයෙන් දායක පුස්තකාල 06න් ආරම්භ වූ මෙම ව්‍යාපෘතිය 2001 අවසන් වන විට දායක පුස්තකාල 68 දක්වා වර්ධනය වී විශාල ව්‍යාපෘතියක් බවට පරිවර්තනය විය. ඒ අනුව විශ්ව විද්‍යාල පුස්තකාල, මහජන පුස්තකාල, විශේෂ පුස්තකාල, කාර්මික පුස්තකාල සහ රජයේ සහ රජයේ නොවන ආයතනික පුස්තකාල මෙයට දායක වී ඇත.

වර්තමානයේ දී පරිගණක දත්ත පදනමක් වශයෙන් ව්‍යාප්ත වී පරිගණකගත ඩිස්කට් ස්වරූපයෙන් පවා පාඨකයන් වෙත තොරතුරු ලබා දීම සිදු වේ.

මෙම ජාතික කර්තව්‍යයට ඔබ පුස්තකාලයේ සහයෝගය ද අවශ්‍ය බව මෙහිලා සඳහන් කරන අතර ජාතික ඒකාබද්ධ සූචිය සම්පාදනය හා මැනවින් පවත්වාගෙන යාම කාර්යක්ෂම ව ඉටු කිරීම තුළින් පර්යේෂකයන් හා අනෙකුත් සියලුම පාඨකයන් හට මෙරට පුස්තකාලවල ඇති පුස්තකාල ද්‍රව්‍ය මගින් තොරතුරු ලබා දීමේ දී මහඟු සේවයක් ඉටු කිරීමට හැකිවනු ඇත.

ලෝක පොත් හා ප්‍රකාශන හිමිකම දිනය නිමිත්තෙන් පැවති සම්මන්ත්‍රණය

உலக நூல் மற்றும் வெளியீட்டுரிமைத் தினத்தின் நிமித்தம் நடத்தப்பட்ட மாநாடு

Seminar to mark the World Book and Copy Right Day, 23.04.2002







දකුණු පළාතේ පුස්තකාල සහායකයන් සඳහා පැවති පුහුණු පාඨමාලාව, ගාල්ල.

தென் மாகாண நூலக உதவியாளர்களின் பொருட்டு நடத்தப்பட்ட பாடநெறி - காலி

Training Programme for Library Attendants in Southern Province, Galle. 7 - 10.06.2002

ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ 42 වන වාර්ෂික සමුළුව

இலங்கை நூலக சங்கத்தின் 42 ஆவது வருடாந்த மாநாடு

42nd Annual General Meeting of Sri Lanka Library Association at Galadari hotel, 28.06.2002



National Digitization Project

*National Science Foundation*

Institute : National Library and Documentation Services Board

1. Place of Scanning : National Library and Documentation Services Board, Colombo 07

2. Date Scanned : 2017/10/12

3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara

4. Scanning Officer

Name : N.P.R.Gamage

Signature : ..........

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Library Documentation Officer

Name : Iromi Wijesundara

Signature : ..........

Date : 2017/10/12

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*